

මහා කාරුණික වූ ප්‍රඥාවෙන් අග්‍රේෂ්වර වූ සියලු දෙව් මිනිසුන් හට
විමුක්තියේ මාර්ගය විවර කළ ශ්‍රීමත් සුගත තථාගත ගෞතම සම්මා
සම්බුදු රජාණන් වහන්සේට අපගේ නමස්කාරය වේවා!



මහමෙව්නාව භාවනා අසපු සංචිතයේත්, ශ්‍රද්ධා මාධ්‍ය ජාලයේත්
නිර්මාතෘවර සහ ප්‍රධාන අනුශාසක
අතිපූජනීය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ.

**ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව පුණ්‍ය ව්‍යාපෘතිය සඳහා**
**සෙනෙහසින් අවවාද අනුශාසනා කරමින් අප හට නිරතුරු මග පෙන්වන**
**අපගේ ගුරුදේවෝත්තම කල්‍යාණමිත්‍ර**
**පින්වත් ලොකු ස්වාමීන් වහන්සේට අපගේ නමස්කාරය වේවා !**

ශ්‍රද්ධා රූපවාහිනිය
369, හේවාගම, කඩුවෙල.
දුරකථන : 0112 571 471
ෆැක්ස් : 0112 548 400
ඊ-මේල් : info@shraddha.lk
වෙබ් : www.shraddha.lk

මහමෙව්නාව
භාවනා අසපුව

ශ්‍රද්ධා
රූපවාහිනිය

ලක්විරු
ගුවන්විදුලිය
LAKVIRU RADIO

අනේක දුක් කම්කටොලු මැද
උපයාගත් මුදල් තුටු සිතින් ම
ජීවිතය ජය ගන්නට වෙර දරන
දැයේ දූ දරුවන්ට
මහත් සෙනෙහසින් දයාද කරන
දයාබර කැපකරු මව්පියවරුන් සියලු දෙනා ද
අනේක දුක් කම්කටොලු මැද
ගුණයෙන් නුවණින් පිරිපුන් අනාගතයකට
පෙරමං තනන ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්වලාභී
පින්වත් දරුවන් සියලු දෙනා ද
නිදුක් වෙත්වා ! නීරෝගී වෙත්වා ! සුවපත් වෙත්වා !
දුර්ලභව ලද ගෞතම බුදු සසුන
නිමවන්නට මත්තෙන් ඉතා සුවසේ ම
උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කොට
මේ දුක්ඛිත සසර ගමනින්
නිදහස් වීමේ වාසනාව ලබත්වා!

නමෝ බුද්ධාය!

ව්‍යවහාර වර්ෂ 2019ක් වූ ඔක්තොම්බර් මස 14 දින දී ය.

පින්වත් දුවේ පුතේ,

උපදින්නට අනන්ත අප්‍රමාණ තැන් තිබිය දී ඔබ අප මිනිස් ලොව උපන්නා. ඒ වගේ ම උපදින්නට බොහෝ රටවල් තිබිය දී අප මේ හෙළදිව ම උපන්නා. ඒ සියල්ල අප සසරේ රැස් කළ මහා පිනක ප්‍රතිඵලයක්.

අප මිනිස් ලොවට නොපැමිණියා නම්, දෙව්ලොව ද මග හැරුණා නම් අපට පින් පව් ගැන, කුසල් අකුසල් ගැන මේ ආකාරයෙන් අසන්නට ලැබෙන්නේ නැහැ. ඒ වගේ ම යි... අප මේ මාතෘභූමිය නොලැබුවා නම්, ඒත් අපට මේ සොඳුරු ධර්මය මේ ආකාරයෙන් මුණගැසෙන්නට තිබෙන්නේ බොහෝ ම පුංචි ඉඩකඩක්. ඇත්තෙන් ම, මුණනොගැසෙන්නයි වැඩි ම අවස්ථාව තිබෙන්නේ.

දුවේ පුතේ, අප උපන්න මේ රට සාමාන්‍ය රටක් නොවෙයි. මේ මහා භද්‍ර කල්පයේ ලොව පහළ වී වදාළ සතර බුදුරජාණන් වහන්සේලා විසින් ම සේවනය කරන්නට යෙදුණු, උන්වහන්සේලාගේ බුද්ධ ශාසන පිහිටුවන ලද, උන්වහන්සේලාගේ ධාතු තැන්පත් වූ මහා සෑයන් කරවන ලද, සම්මා සම්බුද්ධත්වය ලබන මොහොතේ උන්වහන්සේලාට සෙවණ සලසාලූ උත්තම බෝධි වෘක්ෂයන්ගේ දක්ෂිණ ශාඛාවන් පිහිටුවන ලද බුද්ධ පරිභෝග පින්බිම තමයි අප උපන් මේ මව්බිම. මේ බිම සෑම බුද්ධ ශාසනයක දී ම දෙව්බඹුන් විසින් වන්දනාමාන කරන ලද, ආරක්ෂා කරන ලද අසිරිමත් බිම්කඩක්. මේ මව්බිම ගැන දරා ගත් අභිමානයක් අප සිත්හි තිබිය යුතු ම යි.

දුවේ පුතේ, සම්බුදුරජාණන් වහන්සේ යම් දිනෙක ද මේ බිමෙහි පළමු ව සිරිපා කමල තබන ලද්දේ එදින පටන් මේ බිම මිනිස් වාසයට සුදුසු පිරිසිදු බිමක් වගට පත් වුණා. අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ යම් දිනෙක ද ශාසන දයාදය රැගෙන මෙහි වැඩම කරලන ලද්දේ එදින පටන් මේ බිම පරම ශ්‍රේෂ්ඨ ශ්‍රී සද්ධර්මය ජීවන සම්ප්‍රදයේ අක්මුල් සිසාරා විසිර පැතිර ගිය ආර්යයන්ගේ නවාතැන බවට පත් වුණා.

හිරුගෙන් නැගෙන රශ්මි කදම්භය පොළොවට නොවැටෙනා තරමින් අහසින් වැඩම කරනා ඍද්ධිමත් රහතන් වහන්සේලාගේ යුගයක් ගැන කියැවෙන්නේ මේ රටේ. අහසින් වැටෙන එක දිය බිඳුවකුදු ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යා නො දී කෙත්වතු අස්වද්ද ස්වයංපෝෂිත ධාන්‍යාගාරයක් බිහි කළ ඉතිහාසය උරුමය වූයේ ද මේ රටේ. අරහත් ධජ දරූ යතිවරයාණන් වහන්සේලා කුල දේවතාවුන් ලෙසින් පිළිගෙන උන්වහන්සේලාගේ අවවාද අනුශාසනා අනුව රට කරවූ බෝසත් ගුණැති දැහැමි රාජරාජ මහාමාත්‍යාදීන් සිටියේත් මේ රටේ. ඉරෙන් හඳෙන් වැඩ ගත්, කිසිදු ජාතියකට යුධ කොට සහමුලින් යටත් කොට ගන්නට නොහැකි වූ අදීන ජාතියක් බිහි වුණේත් මේ රටේ. දුවේ පුතේ, ඒ තමයි අපේ වීර පුරාණය.

අප නිවට නියාලු, බයාදුකම් පිරුණු ජාතියක් නොවෙයි. ශාසන දයාදය තුළ ගුණයෙන්, නුවණින්, කුසලතාවයන්ගෙන් වැඩී යමින් ලොව අද්විතීය ශිෂ්ටාචාරයක් බිහි කරලන ලද්දේ අපගේ මුතුන්මිත්තන්. ඔවුනගේ යශෝරාවය ඉතිහාසයේ සිට හඬ දෙමින් අපට කියන්නේ අප කොතරම් විශිෂ්ට ජාතියක් වූවා ද යන්න යි. දුවේ පුතේ, ඒ අප විසින් උගත යුතු, මතක තබා ගත යුතු අපේ පරපුරේ අභිමානවත් වංශ කථාව යි.

සම්බුදුරජාණන් වහන්සේගේ පහළ වීමෙන් ශ්‍රේෂ්ඨත්වයට පත් ශාක්‍ය වංශයට ලේ නෑකමින් බැඳී යමින්, ධර්මය නිසාවෙන් ම සුවිශිෂ්ට ජීවන සම්ප්‍රදායක් ගොඩනගමින් අප පැමිණි ඒ මග අප මිස අන් කවුරු නම් සාඩම්බරයෙන් සිහි කරන්න ද? මතක තබා ගන්න ද? අභිමානනීය ඒ මහා වංශකථාව ඔබත් ගෞරවයෙන් පරිශීලනය කරන්න. මතක තබා ගන්න. නුවණින් සලකා කටයුතු කරමින් ශාසන දයාදය ද ඉතිහාසගත අභිමානය ද සුරකිනා වීර පරපුරක පුරුකක් වන්නට ඔබත් අධිෂ්ඨාන කර ගන්න.

ඔබට තෙරුවන් සරණයි!

ගෞතම බුදු සසුන තුළ මෙත් සිතින්,
පූජ්‍ය අලුදෙණියේ සුබෝධි ස්වාමීන් වහන්සේ
ගරු අනුශාසක - ශ්‍රද්ධා මාධ්‍ය ජාලය

# පටුන


01. නන්ද මහරහතන් වහන්සේගේ කථා වස්තුව 12

02. සෙනෙහෙබර ආමන්ත්‍රණය 22

03. තණ්ඩුල නාළි ජාතකය 30

04. පින, උත්සහය සහ නිවැරදි ප්‍රතිපදාව 38

05. නිර්මාණ ඉසව්ව 45

06. කරණීයමෙත්ත සූත්‍රය 58

අමා දම්රස වෑහෙන විස්තරාර්ථ

# ධම්ම පදය

(යමක වර්ගය)

**පූජ්‍යපාද කිරිබත්ගොඩ ඤාණානන්ද**
**ස්වාමීන්ද්‍රයන් වහන්සේ**



දහමෙන් සංවර නොකරගත් විට - කාමෙන් කන්නට වෙයි ගුටි බැට

# නන්ද මහරහතන් වහන්සේගේ කථා වස්තුව

## "ධර්මය තුළින් සිත නොරැකුණොත් අමාරුවේ වැටෙනවා. ධර්මය තුළ රැඳුණු සිත හැම තිස්සෙම රැකෙනවා."

පින්වතුනේ, පින්වත් දරුවනේ, අපේ සිද්ධාර්ථ කුමාරයාගේ පවුලේ තොරතුරු ඔබ සෑහෙන්න දන්නවා. මහමායා බිසවුන් වහන්සේ කළුරිය කළේ සිදුහත් කුමාරයා ඉපදිලා දවස් හතේදී. එයට හේතුව සිදුහත් කුමාරයා ඉපදීම නොවෙයි. තුසිත දෙව්ලොව මහා බෝසතාණන් වහන්සේ වැඩසිටිද්දී පස් මහබැලුම් බැලූ වග ඔබ දන්නවානේ. එතැනදි මව් කවුද කියාත් බැලුවා. බෝසතුන් පිළිසිඳ ගන්නා මවට ඒ පිළිසිඳ ගත් දිනයේ සිට මාස දහයකුත් දවස් හතක් ආයුෂ තිබිය යුතුයි. එබඳු මව් කෙනෙක් තමයි ඕනම බුදුවරයෙකුට බුද්ධ මාතාව වන්නේ. ඒක ධර්මතාවයක්. එහෙම නැතිව සිදුහත් කුමරුන් උපන්න නිසා අසනීප වෙලා මියගියා නොවෙයි. ආයුෂ ඉවර වීමෙන්ම යි මහාමායා බිසව මියගියේ. එතුමිය ඉපදුණේ තුසිත දෙව්ලොව දිව්‍ය කුමාරයෙක් වෙලා. ඊට පස්සෙ බිසව බවට පත්වුණේ ප්‍රජාපතී ගෞතමී දේවියයි. එතුමිය ඉතාමත්ම කරුණාවන්ත කෙනෙක්. තමන්ගේ ම දරුවෙකුට වගේ සිදුහත් කුමාරයාටත් කිරි පොවා සැළකුවා. ඒ ප්‍රජාපතී ගෞතමී දේවියට දරුවන් දෙදෙනෙක් ලැබුණා. පුතා තමයි නන්ද කුමාරයා. දුවට කිව්වේ නන්දා කුමරිය කියලයි. සම්බුද්ධත්වයෙන් පසු බුදුරජාණන් වහන්සේ කපිලවස්තු නගරයට වැඩම කළ බව අපි කලින් කතා කළා නෙ. සුද්ධෝදන රජතුමාගේ ඔටුන්න හිමි කුමාරයා වෙලා හිටිය සිදුහත් කුමාරයා පැවිදි වුණාට පස්සේ ඔටුන්න හිමි කුමාරයා බවට පත්වුනේ නන්ද කුමාරයායි. නන්ද කුමාරයාගේ ඔටුණු පළඳින අභිෂේක මංගල්‍යයත්, අලුතෙන් රජමැදුරට පිවිසීමේ මංගල්‍යයත්,

කුමාරියක් සරණපාවා ගැනීමේ මංගල්‍යයත් එක දවසේ ම කිරීමට යි ඔවුන් කටයුතු සංවිධානය කරමින් සිටියේ. ඔය අතරේ තමයි බුදුරජාණන් වහන්සේ මාළිගාවට වැඩම කරලා ධර්ම දේශනා කළේ. ඒ ධර්මය ඇසූ සුද්ධෝදන රජතුමාත් ප්‍රජාපතී බිසවත් මගඵල ලැබූ බව ඔබ දන්නවා.

ඉතින් එදා බුදුරජාණන් වහන්සේ රජමාළිගාවේ දහම් දෙසලා ආපසු නිග්‍රෝධාරාමයට වඩින්න සූදානම් වුනා. නන්ද කුමාරයා උන්වහන්සේ ළඟින් හිටගෙන සිටියා. "පින්වත් නන්ද, මේ පාත්‍රය ගන්න" කියලා නන්ද කුමාරයාගේ අතට බුදුරජාණන් වහන්සේ තම පාත්‍රය දුන්නා. නන්ද කුමාරයාට හරි සතුටුයි. තමන්ගේ සහෝදරයා බුදුරජාණන් වහන්සේ නමක් නිසා. බුදුරජාණන් වහන්සේ ස්වාමීන් වහන්සේලාත් සමඟ හෙමින් හෙමින් නිග්‍රෝධාරාමයට වඩිනවා. නන්ද කුමාරයා හිතුවේ මාළිගාවේ පඩිපෙළ ළඟදී හෝ දොරටුව ළඟදී හෝ පාත්‍රය ආපසු ගනීවි කියල යි. නමුත් බුදුරජාණන් වහන්සේ පාත්‍රය ආපසු ගත්තේ නැහැ. ඒ නිසා ම උන්වහන්සේත් සමඟම පසුපසින් යන්නට නන්ද කුමාරයාට සිදුවුණා.

ඔය අතරේ නන්ද කුමාරයා සමඟ සරණ බන්ධනයට පැමිණෙන්නට නියමිතව සිටි ජනපද කල්‍යාණී නම් අතිශයින්ම ලස්සන කුමාරිය මාළිගාවේ උඩුමහලේ සඳළුතලයේ සිට බලාසිටියා. ඇය නන්ද කුමාරයාට අතිනුත් ඇස්වලිනුත් හඟවලා කිව්වා ආපසු ඉක්මනින්ම එන්න කියලා. ඇය ආදරයෙන් සිනහ වෙවී බලාගෙන සිටියා. නන්ද කුමාරයා ඇයගේ රූපයට වසඟ වෙලයි හිටියේ. ඔහුත් ඇය දිහා බලලා ඉක්මනින් ම එනවා කියන අදහසින් සිනහ වුණා. අන්තිමේදී නන්ද කුමාරයා පාත්‍රයත් අරගෙන නිග්‍රෝධාරාමය දක්වා ම ගමන් කළා. නිග්‍රෝධාරාමයේදී පාත්‍රය බුදුරජාණන් වහන්සේගේ අතට දුන්නා.

බුදුරජාණන් වහන්සේ නන්ද කුමාරයාගෙන් මෙහෙම අසා වදාළා.

"පින්වත් නන්ද, ඔයත් මේ අනිත් ස්වාමීන් වහන්සේලා වගේ පැවිදි වුණොත් හොඳයි නේද?"

නන්ද කුමාරයාට කරගන්න දෙයක් නැහැ. ජනපද කල්‍යාණීව මතක් වෙන්න ගත්තා. ආපසු මාළිගාවට දුවගෙන යනකල් සිහි නැතුව හිටියේ. නමුත් දැන් බුදුරජාණන් වහන්සේ ම පැවිදි වෙන්න කියනවා. තමන්ගේ ආදරණීය සහෝදරයාණන් වහන්සේ සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ පැවිදි වෙන්න කියා කියද්දී මඟ හරින්නේ කොහොමද? ඒක කොහොමත් ම කරන්න බැහැ. නන්ද කුමාරයා "හොඳයි ස්වාමීනී" කියලා කැමති වුණා.

පින්වතුනේ, පින්වත් දරුවනේ, බැලූ බැල්මට පෙනෙන්නේ නන්ද කුමාරයාට මහා අසාධාරණයක් වුණා වගේ. ඔටුණු පළඳින්න සිටිය, ලස්සන ම කුමාරිකාවක් සමඟ විවාහ වෙන්න හිටිය කුමාරයෙකුට ඒ අවස්ථාව නැති වුණා නේද කියලා ඔබට හිතෙන්නට පුළුවනි. නමුත් අප මෙතැනදී සිතිය යුත්තේ අපි බලන පිළිවෙළට නොවෙයි. බුදුරජාණන් වහන්සේ නමක් මේ ජීවිතය දිහා බලන පිළිවෙළටයි.

පින්වතුනේ, පින්වත් දරුවනේ, මේ සංසාරය කියල කියන්නේ සතර අපායෙහි වැටි වැටී යන ගමනක්. ඒ ගැන බුදුරජාණන් වහන්සේ මේ විදිහට අවබෝධ කරගෙන තියෙනවා. යම් කෙනෙක් සක්විති රජවෙලා උපන්නොත් ඒක මේ සාමාන්‍ය රජකමකට වඩා ඉතාමත් ම ශ්‍රේෂ්ඨ දෙයක්. ඒකට හේතුව නම් ඒ සක්විති රජතුමා ධර්මයෙන් මිසක්, අධර්මයෙන් රජ කරන්නේ නැතිකමයි. ඔහු අවි ආයුධවලින් තොරව රටවැසියා සීලයෙහි පිහිටුවලා, ධර්ම රාජ්‍යයක් බිහි කරනවා. ඒක විශාල පිනක්. ඒ පින නිසාම ඒ සක්විති රජුත් මරණින් මතු දෙවියන් අතරේ උපදිනවා. නමුත් ඒ දෙවියන්ගේ දිව්‍ය ආයුෂ අවසන් වුණාට පස්සේ නිරයේ උපදින්න වුණත් පුළුවනි. තිරිසන් අපායේ උපදින්න වුනත් පුළුවනි. ප්‍රේත ලෝකයෙහි උපදින්න වුණත් පුළුවනි. ඒ කියන්නේ ඒ කෙනා ඕනම අපායක උපදින්න පුළුවන් බවයි. ඔහුට තිබෙන්නේ එවැනි අනතුරක් නම්, ඒ සක්විති රජකම ඉතා ම තාවකාලික එකක් නොවේද?

නමුත් පින්වතුනේ, පින්වත් දරුවනේ, ඉතා දිළිඳු කෙනෙක් වුණත් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරලා සෝවාන් වුනොත් එයා මරණින් මතු දෙවියන් අතරේ උපදිනවා. ඉතින් ඒ කෙනා ඒ දිව්‍ය ආයුෂ අවසන් වුණාට පස්සේ එක්කෝ මිනිස් ලෝකෙට ඒවි. එහෙමත් නැත්නම් ආයෙමත් දෙවියන් අතර උපදීවි. ඒ කෙනා කිසිසේත් ම කවදාවත් ආයෙ සතර අපයේ වැටෙන්නේ නැහැ. එහෙම නම් වඩාත් ම රැකවරණයක් තියෙන්නේ කාටද? සක්විති රජතුමාටද? සෝවාන් වුණු දුප්පත් කෙනාටද? මේ නිසා බුදුරජාණන් වහන්සේ ධර්මය අවබෝධ කිරීම ම යි වඩාත් ශ්‍රේෂ්ඨ ලෙස දැක්කේ. උන්වහන්සේ මෙහෙම වදාළා.

"මේ මහා පොළොවේ අධිපතිකම ලබනවාටත් වඩා, දෙව්ලොව උපදිනවාටත් වඩා, සියලු ලොවට අධිපති වනවාටත් වඩා, සෝවාන් වීම ම උතුම්" කියලා.

ඒ නිසා නන්ද කුමාරයාගේ පැවිදි වීම ගැන අපි සිතන්න ඕන ඔය විදිහටමයි. එහෙම නැත්නම්, අපට මේ වෙනස තේරුම් ගන්න බැරිව යනවා. නන්ද කුමාරයාත් ජනපද කළ්‍යාණිත් හැමෝම මහණ වෙලා රහත් වෙන්න පින් තිබුණ අය. ඒක දන්නෙ බුදුරජාණන් වහන්සේ විතරයි.

ඉතින් පින්වතුනේ, පින්වත් දරුවනේ, නන්ද කුමාරයා පැවිදි වුණා. දැන් නන්ද ස්වාමීන් වහන්සේ ලස්සන සිවුරු පොරොවනවා. වටිනා පාත්‍රයක් පරිහරණය කරනවා. ඇතැම් විට ඇස්වල අඳුන් පවා ගානවා. මෙයා පැවිදි වුණාට ලස්සනට ඉන්නමයි කල්පනාව. වනයට ගියත්, ගස් සෙවනට ගියත්, තනි වුණු හැම වෙලාවෙ ම ජනපද කල්‍යාණියගේ රූපය ගැන හිත හිතා ඉන්නවා මිසක්, ධර්මය සිහි කරන්නේ නැහැ. එතකොට නන්ද ස්වාමීන් වහන්සේගේ සිහි නුවණ පිරිහෙනවා. රාග සිත් ඇති වෙනවා. අන්තිමේදී ජනපද කල්‍යාණිය ගැන හිතල හිත හොඳටම විසිරුණා. සිහිනෙන් පෙනෙන්නෙත් ජනපද කල්‍යාණි ඔහුට අඬගසන ආකාරයයි.

අන්තිමේදී සිත හදාගැනීම හොඳට ම බැරි වුණා. සිවුරු හැර යන්න තීරණය කළා. ස්වාමීන් වහන්සේලාට කිව්වා.

"අනේ... මට හරි අමාරුයි. ඇඟ බරයි. සිතට සැහැල්ලුවක් නෑ. කරන්න ඕන කුමක්ද කියලා මට තේරෙන්නෙ නෑ. මං මේ සිල් රකින්නේ සතුටින් නොවේ. මං ආපසු මාළිගාවට යනවා."

මෙය ඇසූ ස්වාමීන් වහන්සේලාට මහත් අනුකම්පාවක් හටගත්තා. ශරීරයක් තුළ තිබෙන්නේ අපවිත්‍ර දේවල් ගොඩක්මයි. ඇස්වලින් කඳුළු ගලනවා. කබ ගලනවා. කනෙන් කලාඳුරු ගලනවා. නාසයෙන් සොටු ගලනවා. කටින් කෙළ ගලනවා. ඇඟෙන් දහඩිය ගලනවා. මල මුත්‍ර ගලනවා. මේවා හැර මේ සිරුරින් කවදාවත් සුවඳක් හමන්නේ නැහැ. අපවිත්‍ර දේවල් පිරී ගිය පිට පෙනුම විතරක් අලංකාර භාජනයක් වගේ. ඒ පිට ඔපයට තමයි සියලු දෙනාම රැවටෙන්නේ.

රහතන් වහන්සේලාට, නන්ද ස්වාමීන් වහන්සේ ගැන මහත් අනුකම්පාවක් හටගත්තා. ස්ත්‍රියකගේ රූවට වසඟ වී සිතෙහි හටගත් රාගයට මුලා වී අමාරුවේ වැටෙන්නයි යන්නේ. අයෙ අයෙමත් මැරෙන උපදින සංසාරෙටමයි වැටෙන්න යන්නේ. බුදුරජාණන් වහන්සේට නන්ද ස්වාමීන් වහන්සේගේ මේ කළකිරීම ගැන සැළ කළා.

එදා බුදුරජාණන් වහන්සේ නන්ද ස්වාමීන් වහන්සේට අඬ ගසා වදාළා, "පින්වත් නන්ද, මෙහෙ එන්න... අපි ගමනක් යමු" කියලා නන්ද ස්වාමීන් වහන්සේගේ අතින් අල්ලා ගත්තා. එතකොටම බුදුරජාණන් වහන්සේ නන්ද ස්වාමීන් වහන්සේ සමඟ දෙව්ලොව පහළ වුණා. නන්ද ස්වාමීන් වහන්සේට හරිම පුදුමයි.

"ෂා...! එහෙනම් මේක තමයි දිව්‍ය ලෝකෙ කියන්නේ. හා... හරිම පුදුමයි. අන්න... අන්න... දිව්‍ය අප්සරාවන් එනවා. අන්න... දිව්‍ය අප්සරාවන් එන්නේ මේ පැත්තටයි. ෂා...! හරිම ලස්සනයි. හිස කෙස් රන්වන් පාටයි. දෑස් නිල්වන් පාටයි. පාවල යටිපතුල් රෝස පාටයි. හැබෑම ලස්සනයි."

නන්ද ස්වාමීන් වහන්සේගේ අසංවර හිතට වැටහුණේ මේ දිව්‍ය අප්සරාවන්ගේ රූප ශෝභාව විතරමයි. නන්ද ස්වාමීන් වහන්සේ පුදුමයෙන් වගේ බලාගෙන හිටියා. ඒ දිව්‍ය අප්සරාවන් හැමෝම ඈත සිටන් ම බුදුරජාණන් වහන්සේට වන්දනා කරමින් නැමී නැමී ආවා. ඉතාමත් ආදර ගෞරවයෙන් වන්දනා කළා. කතාබස් කළා.

නන්ද ස්වාමීන් වහන්සේගේ සිත ඒ දිව්‍ය අප්සරාවන් කෙරෙහි මුලුමනින් ම වසඟ වුණා. ඊට පස්සේ බුදුරජාණන් වහන්සේ ආයෙමත් නන්ද ස්වාමීන් වහන්සේගේ අතින් අල්ලා ගත්තා. වේළුවනාරාමයෙහි පහළ වුණා. නන්ද ස්වාමීන් වහන්සේ දෑස් ලොකු කර ගෙන බුදුරජාණන් වහන්සේ දිහා ඇස් පිය නොහෙළා බලා සිටියා.

"පින්වත් නන්ද, දැන් ඔබට මොකක්ද හිතෙන්නේ? වඩාත් ම ලස්සන කවුද? ජනපද කළ්‍යාණිද? දිව්‍ය අප්සරාවන්ද?"

"ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, මට තවමත් පුදුමයි. තවමත් සිතාගන්න බැහැ. තවමත් සිහිනයක් වගේ. එතරම් ම ලස්සන අප්සරාවන් මේ ලෝකේ ඉන්නවාද කියලා මං දෙව්ලොව යනකල් ම දැනගෙන හිටියේ නැහැ. ස්වාමීනී, මේ දිව්‍ය අප්සරාවන් ගැන සිතද්දී ජනපද කල්‍යාණී ගැන මට හිතෙන්නේ හේනක පිළිස්සුණු වැඳිරියක් වගේ කියලයි. අප හිතන තරම් ලස්සනක් මිනිස් ශරීරවල නැහැ. ඒක තේරෙන්නේ දිව්‍ය ශරීර දැක්ක විටයි."

බුදුරජාණන් වහන්සේ නන්ද ස්වාමීන් වහන්සේට මෙහෙම වදාළා.

"එහෙම නම් පින්වත් නන්ද, මා ඔබට පොරොන්දු වෙන්නම්. මා කියන ආකාරයට මා දෙන උපදෙස් පරිදි ඔබ සිල් රැක්කොත්, ධර්මයෙහි හැසිරුනොත් ඔබ දෙව්ලොව උපදීවි. එතකොට ඔය අප්සරාවන් පන්සියයක පිරිවරක් ඔබට ලැබේවි."

නන්ද ස්වාමීන් වහන්සේ පුදුමයෙන් පුදුමයට පත් වුණා.

සතුටින් හිනා ගියා. වචන පැටලුණා.

"ස්... ස්වාමීනී, .... ඇ..... ඇත්තක්මද? දිව්‍ය අප්සරාවන් පන්සියයක් ම ලැබෙනවාද?"

"ඔව් පින්වත් නන්ද, දිව්‍ය අප්සරාවන් පන්සියයක් ම ලැබෙනවා."

නන්ද ස්වාමීන් වහන්සේ තුන් වතාවක් ම අහලා තහවුරු කරගත්තා. ආයෙනම් සිවුරු අරින්නේ නැහැ කියලා සිත දැඩි කරගත්තා. සිල් පද ටික පිරිසිදුවට රැක ගන්නවා කියල අදිටන් කරගත්තා. ලස්සන සිවුරු අත්හැරියා. පාංශුකූල සිවුරක් පොරොවා ගත්තා. මැටි පාත්‍රයක් අතට ගත්තා. ඇස්වල තවරාගෙන සිටි අඳුන් සෝදලා දැම්මා. සාමාන්‍ය පැවිද්දෙක් බවට පත්වුණා. හැමෝටම පුදුමයි. කොහොමද මේ ස්වාමීන් වහන්සේ මෙතරම් ඉක්මනින් වෙනස් වුණේ? ටිකෙන් ටික ආරංචි වුණා.

ස්වාමීන් වහන්සේලා නන්ද ස්වාමීන් වහන්සේගෙන් සිනහ වෙවී ප්‍රශ්න කළා.

"හා... ආයුෂ්මත් නන්දයන් ගනුදෙනුවක් කරගත්තලු නේද? කුලියට සිල් රකිනවා නේද? මහණකමත් අඩුමිලට දෙනවා නේද? දිව්‍ය අප්සරාවන් පතා ගෙන බඹසර රකිනවාලු නේද?"

ස්වාමීන් වහන්සේලාගේ මේ කතාබහ අසා නන්ද ස්වාමීන් වහන්සේ ලැජ්ජාවට පත්වුණා. දිව්‍ය අප්සරාවන් ගැන සිතන කොටත් පිළිකුළක් ඇතිවුණා. දිව්‍ය අප්සරාවන්ව එපා වුණා. ජනපද කල්‍යාණිවත් එපා වුණා. අන්තිමේදී උන්වහන්සේ හුදෙකලා වුණා. සමාධිය දියුණු කළා. කෙලෙස් දුරුකරන වීරිය ඇති කරගත්තා. සිත රැකගත්තා. ධර්මයට පැමිණුනා. සියලු කෙලෙසුන් දුරුකරලා රහතන් වහන්සේ නමක් බවට පත්වුණා. බාහිර දෙයට ආශා කිරීම නිසා බොහෝ පීඩා වින්ද නන්ද ස්වාමීන් වහන්සේ අන්තිමේදි ජයගත්තා. ආශාව පරාජයට පත්වුණා. මෙය නිමිති කොට බුදුරජාණන් වහන්සේ ලස්සන ගාථා දෙකක් මේ අයුරින් වදාළා.

**යථාගාරං දුච්ඡන්නං - වුට්ඨී සමතිවිජ්ඣති**
**ඒවං අභාවිතං චිත්තං - රාගෝ සමතිවිජ්ඣති**

නිසි අයුරින් පිළිවෙළකට - වහළ සෙවිලි කොට නැතිවිට
වැසි වසිනා කාලෙට ඒ - වහළින් ගෙට ගලයි වතුර
භාවනාව තුළින් හොඳට - සිත රැකගෙන නොමැති කලට
සංවරකම නැති එසිතට - ගලයි රාග කෙලෙස් කසට

**යථාගාරං සුච්ඡන්නං - වුට්ඨී න සමතිවිජ්ඣති**
**ඒවං සුභාවිතං චිත්තං - රාගෝ න සමතිවිජ්ඣති**

නිසි අයුරින් පිළිවෙළකට - වහළ සෙවිලි කොට ඇතිවිට
වැසි වසිනා කාලෙට ඒ - වහළින් ගෙට නොඑයි වතුර
භාවනාව තුළින් හොඳට - සිත රැකගෙන සිටිනා විට
සංවර වී තිබෙන සිතට - නොඑයි රාග කෙලෙස් කසට

පින්වතුනේ, පින්වත් දරුවනේ, නොවටිනා දෙයට ආශා කිරීම නිසා බොහෝ දෙනෙකුට වටිනා දේවල් අහිමි වෙනවා. සමහරුන් සෙල්ලමට ආසයි. ඒ නිසා ම අධ්‍යාපනය අහිමි කරගන්නවා. දියුණු වෙන්න තිබෙන මාර්ගය නැති කරගන්නවා. අන්තිමේදී පසු තැවි තැවී ඉන්නවා. සමහරු ඉගෙන ගන්න කාලේ ප්‍රේම සම්බන්ධතා ඇති කරගන්නවා. ඒවා ගැන ම කතාබස් කර කර ඉන්නවා. ඒ තුළින් ම සතුටු වෙවී ඉන්නවා. අන්තිමේදී ඒ නිසා ම දුකට පත්වෙනවා. විභාග අසමත් වෙනවා. රැකීරක්ෂාවල් නැති කරගන්නවා.

සමහරු මත්පැන්වලට ආශා කරනවා. උත්සවවලදී මත්පැන් බීලා ආඩම්බරයෙන් නටනවා. පිරිස මැද්දේ කැපී පෙනෙන්න මහන්සි ගන්නවා. මහා ලොකු වීරකමක් කියල හිතාගෙන බොන්න පටන් ගන්නවා. අන්තිමේදී බේබද්දෙක් වෙනවා. මිල මුදල් නාස්ති කරගන්නවා. පව්කාර යාළු මිත්‍රයන් පිරිවරා ගන්නවා. ශරීර සෞඛ්‍ය විනාශ කරගන්නවා. ශෝක වෙවී ජීවිතය අවසන් කරනවා. සමහරුන් සතුන් මරන්න ආසයි. මේ නිසා ම දඩයමේ යනවා. මාළු අල්ලනවා. සතුන්ට වද දෙනවා.

මේ හැමදෙයින් ම සිත පිරිහෙනවා. ඇත්තෙන් ම පිරිහුණු සිතක් තිබෙන නිසාමයි මෙවැනි දේවල් සිතට ඇතුළු වන්නේ. වහලේ හොඳට හෙවිලි කරලා නැති නම්, වැස්ස වහින විට වහළයේ ඒ සිදුරු අතරින් ගෙට වතුර ගලන එක නවත්වා ගන්නේ කොහොමද? පිරිහුණු සිතක් ඇති කෙනාගේ සිතට පව්වු ආශාවල් ඇති වෙන කොට වළක්වාගන්නේ කොහොමද? ඒක ඉතාම අමාරු දෙයක්. මේ ලෝකයේ බොහෝ දෙනෙක් ජීවත් වෙන්නේ සිතට රැකවරණයක් නැතුවයි. ඒ නිසා තමන්ගේ සිතේ කෙලෙස් ඇති වෙලා ඒ කෙලෙස් විසින් තමාව විනාශ කර දමන්නේ තමා නොදැන සිටිද්දීමයි.

පින්වතුනේ, පින්වත් දරුවනේ, දහම තුළ රැකගත් සිත හරි ම අසිරිමත්. ඒ සිත පූජනීයයි. බාහිර කෙනෙකුට මොනම ක්‍රමයකටවත් ඒ පිරිසිදුකම නැති කරන්න බැහැ. සිත අපිරිසිදු වන්නේ රාගය, ද්වේෂය, මුලාව, ආඩම්බරකම, ඊර්ෂ්‍යාව, පළිගැනීම, එකට එක කිරීම, ගුණමකුකම, කෙළෙහිගුණ නොදැනීම ආදී දේවල්වලිනුයි. සිත පිරිසිදු වෙන්නෙත් ඔවැනි දේ දුරු කිරීමෙනුයි. එතකොට සංවරකම, සිහිනුවණ, වීරිය, ගුණවත්කම, නිහතමානීකම, නොඇලීම, මෛත්‍රිය ආදී උසස් දේවල් සිත තුළ වැඩෙනවා. එයින් තමයි රැකවරණය ලැබෙන්නේ. නිවසක වුණත් වහළය හොඳින් සෙවිලි කොට තිබෙනවා නම්, කොයිතරම් වැස්සත් ප්‍රශ්නයක් නැහැ. ඒ වැස්සෙන් ගේ ඇතුළ තෙමෙන්නේ නැහැ. ධර්මය තුළින් රැකවරණය ලැබූ සිත අන්න ඒ වගේමයි. යහපතක් ම සැලසෙනවා. අයහපතින් වළකිනවා.



# සෙනෙහෙබර
# ආමන්ත්‍රණය

# ආදරණීය දුවේ... පුතේ...

දයාබර දරුවනි, ජීවිතය යහපත් කරගැනීමට, සුන්දර කර ගැනීමට ඔබ දරන උත්සාහයට මහත් අස්වැසිල්ලක් ගෙන දෙන දයාබර කැපකරු දෙමාපියන් ඔබ වෙනුවෙන් එවූ තවත් සටහනක්...

*නමෝ බුද්ධාය!*

*ආදරණීය දිල්ෂාන් පුතා වෙත.*

*පුතා එවූ ලිපිය ලැබුණා. පළමුව කියන්න ඕනෙ පුතාගෙ අකුරු හුගාක් ලස්සනයි. පුතා පළමුව මට ලිපියක් එව්වෙ 2017-07-20 දා. එදා සිට එවූ ලිපි සියල්ල මම එකතු කළා. ඔබේ අකුරු ලිවීම ක්‍රමක්‍රමයෙන් ලස්සන වූ අයුරු මම දැක්කා. ඒ කියන්නෙ පුතා ඉගෙනීමටත් දක්ෂතාවයක් දක්වනවා කියන එකයි. අපිට දැනෙන්නෙ දිල්ෂාන් පුතා අපේ ම දරුවෙක් වගේ. මේ විදිහට හැකියාව ඇති අය දරුවන්ට ඉගෙනීමට උදව් කරනවා තමයි.*

*නමුත් අපේ ලොකු ස්වාමීන් වහන්සේ මේ කරනා සේවයට අපි උන්වහන්සේට ආශිර්වාද කරනවා. ඇයි කියනවා නම් මේ ලෙස අප සම්බන්ධ කළ නිසා.*

*පුතා එවන ලිපි කියවීමෙන් අපි හුගාක් සතුටු වෙනවා. ඒ වගේ ම පුතාට අපි ළං වෙනවා.*

*පුතා හොඳට ඉගෙන ගන්න. දැන් බාහිර වැඩ මදකට නවත්තලා පාඩම් වැඩවලට උනන්දු වෙන්න. අපි ප්‍රාර්ථනා කරනවා පුතා විභාගයෙන් හොඳට ජය ගනීවි කියලා. ගුණ නුවණ දෙකම දියුණු කරගන්න. පසිදුරන් රවට්ටන බොහෝ දේ ඇතත් ඒවාට නොරැවටෙන්න. පුතා කවදා හරි හොඳට ඉගෙන ගෙන ලොකු මහත්තයෙක් වෙලා අපිට මුණගැසුනු විට අපිට කොතරම් සතුටක් ද?*

*පුතාට සහ පවුලේ සැමට තෙරුවන් සරණයි.!*

*මෙයට කැපකරු මව්පිය දෙදෙනා.*

නමෝ බුද්ධාය!

ආදරණීය පුතුණි.

ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව යටතේ ශ්‍රද්ධා මාධ්‍ය ජාලය හරහා පුතු විසින් එවන ලද ලිපි දෙකක්ම ලැබුණු බව ඉතා සතුටින් දන්වා සිටිමි. නමුත් මා හට පිළිතුරු ලිපියක් ලිවීමට නොහැකි වූයේ මාගේ මහත්මයාගේ තුන් අවුරුදු දානමය පුණ්‍යකර්මය සහ මාගේ ඇසේ ශල්‍යකර්මයක් හේතුවෙනි. ඒ නිසා මා පළමුව ලිපිය පමාද වූවාට පුතුගෙන් සමාව අයදිමි.

පුතුගේ පළමු වාරයේ ප්‍රගති වාර්ථාව දැක මම සතුටට පත් වූයෙමි. පුතුගේ ලිපිවලින් මා දුටු ලොකු දෙයක් ගැන කතා කිරීමටයි විශේෂයෙන් මා ලිපිය ලියන්නේ. පුතු දැන් ඉගෙනුම ලබන්නේ 9 වන ශ්‍රේණියේ නමුත් පුතුගේ අකුරු මීට වඩා ලස්සන විය යුතුයි. මා ඒ සඳහා පුංචි උපකාරයක් කියන්නම්. පරණ පුවත්පත් කිහිපයක් රැගෙන ලොකුම අකුරු සහ පුංචිම අකුරු අත්හැර මධ්‍යම ප්‍රමාණයේ අකුරු උඩ ඒ අයුරින්ම නැවත ලියන්න. එවිට එම අකුරුවල හැඩයට අත හුරු වී ලස්සනට පුතුටත් ලියන්න හැකි වේවි. මේ මාගේ දරුවන්ට මා දුන් උපදෙසක්. මාගේ පුතුටත් දුවටත් පුංචි කාලෙ සිටම මේ අයුරින් අකුරු ලිවීමට පුහුණු කළා. දැන් ඒ අය ලොකුම ලොකුයි. ඒ අයගේ අකුරු දැන් පුවත්පත් අකුරු වලට වඩා ලස්සනයි.

පුතු ගණිතය විෂයටත්, ඉංග්‍රීසි විෂයටත් මීට වඩා උනන්දු වන්න. හොඳින් ඉගෙන ගෙන දෙමාපියන්ටත් රටටත් වැඩදායී දරුවෙකු වන්න පුතේ. කල්‍යාණ මිතුරන්ම ඇසුරු කරන්න. පුතුට විශේෂ පොත් අවශ්‍ය නම් ශ්‍රද්ධා මාධ්‍ය ජාලය හරහා මාව දැනුවත් කර ඒවා ලබාගන්න.

පුතුගේ මල්ලීටත් යහමග කියා දෙමින්, මවටත් උපකාර කරමින් අධ්‍යාපන කටයුතු හොඳින් කර ගැනීම සඳහා තුනුරුවනේ ආශිර්වාදය පතමින් මම නවතිමි.

තෙරුවන් සරණයි..!

පුතුට නිදුක් නිරෝගී සුවපත් අනාගතයක් පතන කැපකරු මව.

# ආදරණීය අම්මේ... තාත්තේ...

මේ ඔබෙන් ලද මහගු දායාදයට කෘතගුණ එක්වූ තවත් සෙනෙහෙවන්ත සටහන්...

*නමෝ බුද්ධාය!*

*මාගේ දයාබර කැපකරු අම්මේ තාත්තේ,*

*පින්වත් දෙමව්පියනි, ඔබ දෙදෙනාට කොහොම ද? ඔබ දෙපළ සුවෙන් සිටිනවා නේද? ආදරණීය අම්මේ තාත්තේ, ඔබ දෙදෙනා මාගේ අධ්‍යාපන කටයුතු ඉටුකර ගැනීමට කරන මෙම උපකාරයට මුලින්ම බොහෝ සේ පින් අත්වේවා! යි මාත් මගේ දෙමව්පියන් දෙපළත් එකසිතින් කෘතඥ පූර්වකව ප්‍රාර්ථනා කරමු. ඉතින් පින්වත් අම්මේ, තාත්තේ, ඔබගේ ද උපකාරයෙන් මා විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කටයුතු හොඳින් කරගෙන යන බව සතුටු සිතින් සිහිපත් කරන්නට කැමැත්තෙමි. විශ්ව විද්‍යාල අධ්‍යාපන කටයුතු වලට අමතරව* Chatered *විභාගය සඳහා ද, මාගේ ගමන් වියදම් වලට මෙන් ම විශ්ව විද්‍යාලයේ දී කෑම වියදම් ආදිය සඳහා ද ඔබ ලබාදෙන මුදල් මා යොදා ගන්නවා.*

*ඉතින් අම්මේ තාත්තේ, ඔයාලා ලබාදුන් මුදල් වලින් මා පාරේ අසරණව සිටි ඒ වගේ ම බසයේ දී ත් කිහිපදෙනෙකුටම මුදල් පරිත්‍යාග කළා. ඒ වගේ ම මාගේ මල්ලිලා සමඟ එකතු වී ළඟ දී රුවන්වැලි මහා සෑයට නෙළුම් මල් දන්සැලක් ලබා දුන්නා. ඒ ආදී වශයෙන් විවිධ පින් රැස්කරගත්තා. ඒ සියලු පින් ආදරණීය අම්මටයි තාත්තටයි එකසේ අත්වේවා!යි අනුමෝදන් කරමි. මා හට උපකාර කළ මේ පින ඔබ දෙදෙනාට පාරමිතාවක්ම වේවා!යි මා ප්‍රාර්ථනා කරමි. ඔබ දෙපලට උතුම් සිල් ගුණදහම් ආදිය ආරක්ෂා කරමින් උතුම් තුනුරුවනේ අනන්ත වූ ආශිර්වාදයෙන්, මේ සියලු පින් බලෙන් මේ බියකරු සසර කෙළවර අමා මහ නිර්වාණ සම්පත්තියම සාක්ෂාත් කරගැනීමට හැකි වේවා! යි මා ප්‍රාර්ථනා කරමි. ඔබ දෙපළ නිදුක් වේවා! නීරෝගී වේවා! සුවපත් වේවා!*

*තෙරුවන් සරණයි..! අම්මේ තාත්තේ.*

*මෙයට කැපකරු පුතනුවන්*

නමෝ බුද්ධාය!

දයාබර කැපකරු මව්පියනි,

ඔබලා සුවෙන්, සැපෙන් ඇතැයි සිතමි. මාගේ නැණස පාදන්නට ඔබගෙන් ලැබෙන මූලපම දායකත්වයත්, මනැස පුබුදුවන්නට දහම් පුස්තකයන්ගෙන් ලැබෙන ධර්ම දායාදයත් අනගි කොට සලකමි.

පාසලේ නිවාඩුව ආරම්භ වූ නමුත් තෙවන වාර විභාගයේ ලකුණු අපහට ලබා නොදුනි. එම ලකුණු ලැබුණු විගස ඔබ වෙත දන්වා එවීමට කටයුතු කරමි.

ඔබෙන් ලද වටිනා මුදලින් මා හට බොහෝ පින්කම් ද, අධ්‍යාපන මෙවලම් මිලදී ගැනීම ද කළ හැකි විය. අප පාසලේ 143 වන ජන්ම දිනය නිමිති කරගෙන රුවන්වැලි සෑ රදුන් අභියස පහන් පූජාවක් හා දානමය පින්කමක් පැවැත්විණි. ඒ සඳහා වැඩම කළ පොඩි හාමුදුරුවන් වහන්සේලා අටනමක් සඳහා රසකැවිලි මිලදී ගැනීම පිණිස රු.80ක් ද එක් ස්වාමීන් වහන්සේ නමකට පිරිකර සඳහා පොත් 2ක් මිලදී ගැනීමට රු.190ක් ද වැය කළෙමි. එසේ ම පොසොන් පොහොය දින සවස අප පාසලෙන් පැවැත් වූ සව් දන්සැල සඳහා සව් ග්‍රෑම් 250ක් ද ලබා දුනිමි. රසායන විද්‍යාව සඳහා සමතුලිතතාවය පොතක් මිලදී ගැනීමටත් භෞතික විද්‍යාව පන්ති ගාස්තු ගෙවීමටත් ඉතිරි මුදල මට රුකුලක් විය.

ගිය වසරේ මෙන් ම මේ වසරේ ද මන්ච් අනග්‍රහයෙන් පැවැති පද්‍ය රචනා තරගයෙන් "අනුරාධපුරයේ අපි" මැයෙන් මා ලියූ කවි පෙලට ප්‍රථමස්ථානය හිමි විය. 2019-07-04 වන දින ශිෂ්‍ය නායිකාවක් ලෙස දිව්රුම් දීමට ද මට හැකි විය. මා කළ පින්කම් ඔබට අනුමෝදන් කරමින් ද, ඔබට දිගාසිරි පතමින්ද මා නවතිමි.

තෙරුවන් සරණයි.

මීට කැපකරු දියණිය

නමෝ බුද්ධාය!

"තුන්ලෝකාග්‍ර වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!"

මාගේ දයාබර කැපකරු අම්මේ තාත්තේ,

ඔබ දෙදෙනා හට තෙරුවන් සරණයි. දයාබර කැපකරු අම්මාත් තාත්තාත් සුවෙන් සිටිතියි සිතමි. නිදුක් නිරෝගී සුවය. දීර්ඝායුෂ ලැබීමට මාගේ කැපකරු අම්මාටත් තාත්තාටත් මා හට මෙලෙස සිදු කරන්නා වූ කුසලයම හේතු වනු ඇතැයි සිතමි. ඔබ දෙදෙනා මා හට පසුගිය සිව් මස පුරා ලබා දෙන ලද ශිෂ්‍යාධාර මුදල් මම ගතිමි. මම බොහෝ සෙයින් ධාර්මික දිවියක් සඳහා සරල ගති පැවතුම්වලින් යුතුව ධාර්මිකව කටයුතු කිරීමට කැමැත්තක් දක්වමි. ඒ සඳහා මා මෙම ශිෂ්‍යාධාර මුදලෙන් ද නියමිත පරිදි මෙම මහඟු සේවාවට වෙහෙස වන්නා වූ පින්වත් ලොකු ස්වාමීන් වහන්සේටත්, ශ්‍රද්ධා මාධ්‍ය ජාලයෙහි පින්වත් අනුශාසක ස්වාමීන් වහන්සේලාටත්, ශ්‍රද්ධා රූපවාහිනියේ සහ ලක්විරු ගුවන්විදුලියෙහි සියලුම කාර්ය මණ්ඩලයටත් මෙම පුණ්‍ය ව්‍යාපෘතියෙහි දයාබර කාර්යය මණ්ඩලයටත් මාගේ ආදරණීය කැපකරු දෙමව්පිය දෙපලටත් "මෙවැනි වූ මහඟු සේවාවන් ඉදිරියේදීත් සාර්ථකව ක්‍රියාත්මක කර ගැනීමට හැකි වේවා!" යි සෙත් ප්‍රාර්ථනා සිදු කිරීමටත් මාගේ ආදරණීය මෑණියන්ටත්, පියාණන්ටත් යන සැමට සෙත් පතා ශිෂ්‍යාධාර මුදලින් රුපියල් සියය බැගින්, ශිෂ්‍යාධාර මුදල් ලැබුණු මාසයේ පටන් මාතර බෝධි ආරක්ෂක සභාව වෙත විදුලි ආලෝක පූජාව සඳහා ලබා දුන්නේ ඉමහත් මෙත් සිතින් යුතුව වෙමි.

එලෙසම මාගේ කැපකරු අම්මා, තාත්තා මා හට ලබා දුන් මෙම ශිෂ්‍යාධාර මුදල මම මේ අයුරින් පරිශීලනය කළෙමි. මුල් මාස 2 දී (ජනවාරි සහ පෙබරවාරි) ඒ මුදලින් රුපියල් 1500ක් බැගින් උපකාරක පන්ති සඳහා වියදම් කළෙමි. ජනවාරි මස ඉතිරි මුදලෙන් රුපියල් 300ක් පොත් දෙකක් සහ පෑන් මිලදී ගැනීම සඳහා ද, පෙබරවාරි මස ඉතිරි මුදලෙන් අසරණව කුසගින්නේ සිටි මහළු සීයා කෙනෙකුට ආහාර පාර්සලයක් ලබාදීම සඳහා රුපියල් 100ක් ද ඉතිරි රුපියල් 200ක මුදල ගමන් වියදම් සඳහා ද යොදා ගතිමි. මාර්තු මස ලද ශිෂ්‍යාධාර මුදලෙන් රුපියල් 990 ක්

වටිනා භෞතික විද්‍යාව ප්‍රශ්න පත්‍ර වැඩ පොතක් මිළදී ගැනීම සඳහා ද ඉතිරි මුදලින් CR පොත් 4ක් ගැනීමට සහ ඉතිරිය ගමන් ගාස්තු සඳහා ද යොදා ගතිමි. අප්‍රේල් මස ලද ශිෂ්‍යාධාර මුදලින් රුපියල් 1200ක් උපකාරක පන්ති ගාස්තු ලෙස යොදගත් අතර රුපියල් 100ක් වකුගඩු රෝගයකින් පෙලෙන කුඩා බිළිඳකුගේ අවශ්‍ය වියදම් සඳහා උපකාරයක් ලෙස යෙදවූයෙමි. ඉතිරි මුදල් මාගේ බාල සොයුරාගේ පන්ති ගාස්තු ලෙස ලබා දුන්නෙමි. මවද සුළු රැකියාවක නිරත වන අතර මාගේ පියාටද නිවසේ කටයුතු සඳහා අවශ්‍ය මුදල් සොයා ගැනීම නොහැකි තත්වයක පසුවූ පසුගිය මාස කිහිපය තුළ කැපකරු මවත් පියාත් විසින් ලබාදුන් මෙම ශිෂ්‍යාධාර මුදල කෙතරම් නම් සහනයක් මාගේ දෙමව්පියන්ටත් මා හටත් ලබා දුන්නේද යන වග ඔබතුමන්ලාගේ දෙපා වැඳ පැවසීමට ඇතිනම් කියා මා හට සිතීමට තරම් මාගේ සිතට මහත් වූ අස්වැසිල්ලක් වූ බැවින් එය ඔබතුමන්ලා කෙරෙහි අපරිමිත ගෞරවයකුත්, සෙනෙහසකුත් මා හට ජනිත කරවීමට තරම් සමත් විය.

දයාබර කැපකරු අම්මේ, තාත්තේ මා මෙම ලිපිය ලිවීමට සහ එය ඔබවෙත එවීමට තරමක් ප්‍රමාද වී නම් ඒ සඳහා ඔබතුමන්ලාගේ කාරුණික සිතින් මා හට සමාව ලබාදෙන මෙන් අයැද සිටිමි. මා මේ දිනවල මෙම වසරෙහි අගෝස්තු මස පැවැත්වෙන උසස් පෙළ විභාගය සඳහා බොහෝ වැඩ කටයුතුවල නිරත වී සිටීම එයට හේතුවයි. කෙසේ වෙතත් ඒ සියලු වැඩ කටයුතු ක්‍රමානුකූලව කළමනාකරණය කරගනිමින් ඔබතුමන්ලා මා වෙනුවෙන් සිදු කරන්නා වූ මෙම උත්තරීතර වෙහෙස වෙනුවෙන් මාගේ තුති පඬුරු පුද කිරීමට ද මෙලෙස කෙසේ හෝ කාලය වෙන්කර ගතිමි.

මා 13 වන ශ්‍රේණියෙහි දෙවන වාර විභාගය සඳහා ද පෙනී සිටි අතර (මාර්තු මස) එහි ප්‍රශ්න පත්‍ර බොහෝ දුරට පහසු වන නමුත් එහි දී මා හට හැඟී ගියේ විෂය කරුණු තවත් පාඩම් කිරීමෙහි කටයුතුවල යෙදුනි නම් ඒ ප්‍රශ්න පත්‍ර ඉතාමත් පහසු වන බවයි. ඒ නිසා මා මේ දිනවල ඒ පසුගිය පාඩම්වල විෂය කරුණු නැවත බැලීම සඳහාත් පසුග ිය විභාග ප්‍රශ්න පත්‍ර සහ අනුමාන ප්‍රශ්න පත්‍ර ආදිය ලිවීමටත් කටයුතු කරමි. මාගේ බලාපොරොත්තුව, කෙලෙස හෝ පළමුවරම විභාගයට විශිෂ්ඨ ප්‍රතිඵල ලබාගෙන ගෞරවනීය ලොකු ස්වාමීන් වහන්සේ ඇතුළු මෙම ශිෂ්‍යාධාර ව්‍යාපෘතිය සඳහා දායක

වන සැමට එතුළින් මාගේ තුති පඬුරු පුද කිරීම සහ මාගේ කැපකරු දෙමව්පියන්ට සහ මාගේ මැණියන්ටත් පියාණන්ටත් සතුට උදා කරමින් ඔවුන්ගේ සිහිනය යථාර්ථයක් බවට පත් කිරීම යි.

වෛද්‍යවරියක ලෙස මතු යම් දිනක අසරණ මිනිසුන් වෙත කරුණාවෙන් ඔවුන්ගේ කායික පීඩා මෙන් ම ධර්මාවබෝධය තුළින් ඇතිකරගත් ධාර්මික මනසකින් යුතුව යහපත් මනුෂ්‍ය ගුණධර්ම තුළින් ඔවුන්ගේ චිත්ත පීඩාවන් ද දුරලමින් ලෝකයට වැඩදායී ලෙස කටයුතු කිරීමට හැකි නම් එය කෙතරම් නම් භාග්‍යක් දැයි මා හට නිතර හැඟේ. ඒ සඳහා මා ඉතාමත් ප්‍රිය කරන අතරම මම ඒ අරමුණ උදෙසා නිරතුරුවම වෙහෙස මහන්සි වෙමි. ඒ සඳහා ගෞරවනීය ස්වාමීන් වහන්සේලා ඇතුළු කාර්ය මණ්ඩලයේ ගරු කටයුතු සැමගෙන් ද මාගේ කැපකරු දෙමව්පියන්ගේ ද සෙනෙහෙබර ආශිර්වාදය මම හැමදා බලාපොරොත්තු වෙමි. ගෞරවනීය පින්වත් ලොකු ස්වාමීන් වහන්සේටත් ශ්‍රද්ධා මාධ්‍ය ජාලයේ අනුශාසක පින්වත් ස්වාමීන් වහන්සේලාටත් මාගේ නමස්කාරය වේවා! ශ්‍රද්ධා මාධ්‍ය ජාලයේ සහ ලක්විරු ගුවන්විදුලියේ සියලුම කාර්ය මණ්ඩලයටත්, ශ්‍රද්ධා ශිෂ්‍යත්ව පුණ්‍ය ව්‍යාපෘතියේ දයාබර කාර්ය මණ්ඩලයත් මගේ ආදරණීය කැපකරු මවට සහ පියාටත් ඇතුළුව සියලුම මව්පියවරුන්ටත් නිදුක් නිරෝගී සුවයත් දීර්ඝායුෂයත් ලැබී මෙවැනි වූ පුණ්‍ය කටයුතු වලට මතුවට ද නිරත වීමට ශක්තිය ධෛර්යය සහ ගෞතම බුදුරජාණන් වහන්සේගේ පිහිට ආරක්ෂාව ලැබේවා! යි මම ඉත සිතින් ඉමහත් ගෞරවයෙන් යුතුව ප්‍රාර්ථනා කරමි.
(දෙවන පාසල් වාරය ඇරඹීම ප්‍රමාද වීමත් මෙම ලිපිය එවීමට පෙර අප පාසලෙහි ප්‍රගති වාර්තාව ලබා නො දීමත් නිසා එය පසුව එවීමට කටයුතු කරන බවද දන්වා සිටිමි.)

තෙරුවන් සරණයි.

මීට කැපකරු දියණිය



# තණ්ඩුල නාළි ජාතකය

සහල් නැළියේ කථාව

පින්වතුනේ, පින්වත් දරුවනේ,

අපට ඇති සසර පුරුදු ගැන බලද්දි පුදුම හිතෙනවා. බොහෝ දෙනෙක් කලින් ආත්මවල කරපු දේවල් මේ ආත්මෙත් කරනවා. ඉස්සර කළ මෝඩකම් ආයෙමත් කරනවා. ඉස්සර නුවණින් වැඩ කළ අය මේ ආත්මෙත් නුවණින් වැඩ කරනවා. දැන් අපි ඉගෙන ගන්නේ කලින් ආත්මේ කළ මෝඩකම් ආයෙමත් කළ භික්ෂුවකගේ කථාවකුයි.

භාග්‍යවතුන් වහන්සේ මේ තණ්ඩුල නාළි ජාතකය වදාළේ ඒ භික්ෂුව නිසයි. ඒ භික්ෂුව ගේ නම ලාලුදායි. ඒ සිද්ධිය වුනේ මෙහෙමයි.

මල්ලපුත්‍ර දබ්බ නමැති දරුවෙක් කුඩා අවදියේ ම සසුන්ගත වුනා. ධර්මයෙන් නිසි එල නෙළාගෙන රහත් බවට පත්වුනා. මුන්වහන්සේ ප්‍රසිද්ධ වුනේ දබ්බ මල්ලපුත්‍ර රහතන් වහන්සේ කියල. ඉතින් මේ රහතන් වහන්සේට සිතුනා සංඝයාට උපස්ථාන කරන්න. ඒ ගැන භාග්‍යවතුන් වහන්සේට දැනුම් දුන්නා. එතකොට භාග්‍යවතුන් වහන්සේ මේ භික්ෂුවගේ සසර පැතුම් අනුව භත්තුද්දේසක බවට පත් කළා. ඒ කියන්නේ දානයට ඇරයුම් ලැබුන විට ඒ සඳහා මේ මේ භික්ෂූන් යවන්ට ඕනා කියලා පිළිවෙළකට සංඝයාට දැනුම් දී ඒ දානය සඳහා වඩින්නට සැලැස්වීම යි.

ඉදින් උදේ ම දානයට සංඝයා යොමු කරද්දී ඇතැම් අවස්ථාවලදී ලාලුදායි තෙරුන්ට ප්‍රණීත දානය ඇති තැන්වලට වඩින්ට ලැබෙනවා. ඇතැම් අවස්ථා වලදී නීරස ලාමක දානය ලැබෙන තැන්වලටත් වඩින්ට ලැබෙනවා. නීරස දානයකට බැරි වෙලාවත් ලාලුදායි තෙරුන්ට යන්ට ලැබුනොත් එදාට හරි අවුල්.

“මේ දබ්බයා මොනවාද දන්නේ.... සංඝයාව පිළිවෙළකට යවන්ට දන්නේ නෑ නොවැ..... අපට මේවා තේරෙන්නෙ නෑ කියලද හිතන්නෙ.... හනේ.....! මට දුන්නොත් ඔය වැඩේ මං ලා...ස්සනට කරලා පෙන්නනවා” මේ ලාලුදායි තෙරුන් ගෙන් බේරෙන්ට බැරි

තැන දබ්බ මල්ල පුත්‍රයන් වහන්සේ දානය සඳහා සංඝයාට තුණ්ඩු දීම ලාලුදායි තෙරුන්ට පැවරුවා.

එදා ඉඳලා ලාලුදායි තෙරුන් තමයි සංඝයාට තුණ්ඩු දෙන්ට පටන් ගත්තේ. මේක හොඳ දානයක් ය, මේක ලාමක දානයක් ය කියල දන්නෙවත් නෑ. භික්ෂූන් ගේ වස් ගණන අනුව සංඝයා තෝරන්ට දන්නෙත් නෑ. දානය පිණිස සංඝයා වැඩලා සිටගෙන සිටිද්දී වස් ගණනට සලකන්නෙත් නෑ. ලාලුදායි භික්ෂුව කරන්නේ භික්ෂුව දානය පිණිස ඇවිත් සිටගත් විට මෙතැන මේ භික්ෂුව සිටියා, අතන මේ භික්ෂුව සිටියා කියලා බිම හෝ බිත්තියක හෝ ලකුණක් දානවා.

අනිත් දවසේ තුණ්ඩු ගන්නා භික්ෂූන් අඩුව හෝ සිටින්ටත් පුළුවනි. වැඩිවෙලා සිටින්ටත් පුළුවනි. එතකොට ලාලුදායි භික්ෂුව ලකුණු කළ තැනින් පහළට භික්ෂූන් ටික නමක් සිට ඊට ඉදිරියෙන් භික්ෂූන් වැඩි දෙනෙක් සිටින්ටත් පුළුවනි. එතකොට දානය සඳහා වැඩලා පෝලිමේ ඉන්න භික්ෂූන් ගැන නොසලකා තමන් ලකුණු කරපු තැන ඉන්න භික්ෂූන්ට තුණ්ඩු දෙනවා. එතකොට ඒ භික්ෂූන් ලාලුදායි භික්ෂුවට මෙහෙම කිව්වා.

"ඇවැත් ලාලුදායි.... ඔබ ලකුණු කළ තැන පස්සෙ තිබ්බත් ඉස්සරහ තිබ්බත් වැඩක් නෑ. ප්‍රණීත දානය ලැබුනේ අසවල් වස් ගණනේ භික්ෂූන්ට. ලාමක දානය ලැබුනේ අසවල් වස් ගණනේ භික්ෂූන්ට."

එතකොට ලාලුදායි භික්ෂුව එකට එක කියන්න ගත්තා.

"මං මේ විදිහට සලකුණු දාල තියෙද්දි අර විදිහට ගිහින් හිටගත්තේ මක්කටෙයි....? මට කියන්නේ ඔහේලාව විශ්වාස කරගෙන තුණ්ඩු දෙන්ටෙයි කියලද...? මං විශ්වාස කරන්නේ මං දාපු සලකුණයි."

අලුත පැවිදි වූ තරුණ සාමණේරවරුන්ට ඒ වැඩේ හරි ගියේ නෑ. ඔවුනුත් එකට එක කියන්ට ගත්තා.

"මේ.... ලාලුදායි.... ඔහේගේ තුණ්ඩු බෙදිල්ලෙන් භික්ෂූන්ට ලැබෙන්න නියමිත සංඝ ලාභය හරි විදිහට ලැබෙන්නෙ නෑ. ඔහේට ඔය වැඩේ කොරන්ට බැහැ..... කොටින් ම ඔහේ සුදුසු නැහැ.... ඔහේ යනවා යන්න" කියලා හයියෙන් කතා කළා. ලාලුදායි තෙරුන් කෑ ගහල රණ්ඩු අල්ලන්න පටන් ගත්තා.

භාග්‍යවතුන් වහන්සේට මේ ඝෝෂාව ඇහුනා.

"ආනන්දය..... දානයට තුණ්ඩු බෙදන තැන මහා ඝෝෂාවක් ඇහෙනවා.... රණ්ඩුවක් වගෙයි.... මොකක්ද ඒ කලබල සද්දේ....?"

එතකොට ආනන්දයන් වහන්සේ ලාලුදායි තෙරුන් ගේ අනුවණ ක්‍රියාකලාපය ගැන භාග්‍යවතුන් වහන්සේට සැලකළා.

"ආනන්දය.... ඔය ලාලුදායි දැන් විතරක් නොවෙයි. පෙර ආත්මයකත් මෝඩකම් කරන්ට ගොහින් සෑහෙන්න පාඩු වින්දා."

එතකොට භික්ෂූන් වහන්සේලාට ලාලුදායි තෙරුන්ගේ පෙර ආත්මයේ විස්තරේ දැනගන්ට ආසා හිතුනා. භාග්‍යවතුන් වහන්සේගෙන් ඒ පෙර සිදු වූ දෙය කියා දෙන්ට කියලා ආයාචනා කළා. ඒ වේලාවෙහි භාග්‍යවතුන් වහන්සේ මේ තණ්ඩුල නාළි ජාතකය වදාළා.

"මහණෙනි, ඒක වුනේ මෙහෙමයි. ඈත අතීත කාලෙක කසී රටේ බරණැස් පුරේ බ්‍රහ්මදත්ත කියල රජෙක් සිටියා. ඒ කාලේ බෝධිසත්වයෝ ඒ රජ්ජුරුවන් ළඟ වැඩ කළා. භාණ්ඩවල වටිනාකම තක්සේරු කළ නිලධාරියා හැටියටයි රාජකාරි කළේ. මොහු ඇතුන්ව, අශ්වයන්ව, රන්, රිදී, මුතු, මැණික් වලට සාධාරණ

මිලක් තක්සේරු කළා. එතකොට ඒ ඒ භාණ්ඩවල හිමිකරුවන්ට ඊට අදාළ වටිනාකමට මුදල් ලැබුනා. නමුත් ඒ රජු මහා ලෝභයෙක්. ඔහු මෙහෙම හිතුවා.

"හපොයි...! මේ තක්සේරු නිලධාරියා හිටියොත් මං සුං. මුන්දෑ හරි ගාණට මිළ නියම කොරනවා නොවැ..... මෙහෙම භාණ්ඩ තක්සේරු කොරන්ට ගියොත්.... තව.... ටික කලක් යද්දී... භාණ්ඩාගාරේ ධනය නිකම්ම හිස් වෙලා යාවි..... බැහැ බැහැ.... එහෙම වෙන්ට දෙන්න නාකයි.... මට ගැලපෙන එකෙක්ව පත් කොර ගන්ට ඕනෑ.

රජතුමා උඩුමහලට ගොහින් සීමැදිරි කවුලුවෙන් ඈත බලාගෙන ඔය විදිහට දුක්ඛිත සිතුවිලි සිත සිතා හිටියා. එතකොට ගමේ හිටිය මහා ලෝභ කුණෙක් රජ මිදුලෙන් යනවා දැක්කා. දැකලා මෙහෙම හිතුවා.

"ආන්න යනවා..... මගේ වැඩේට ගැලපෙන එකා..... ඒකාව ගෙන්න ගන්ට ඕනා."

ඉතින් රජු ඔහුව ගෙන්නලා කිව්වා.

"බොල.... මං තට අගේ ඇති රස්සාවක් දෙන්නම්. භාණ්ඩවල මිල නියම කොරන්ඩ තට පුළුවන් නොවැ"

"එහෙමයි... දේවයන් වහන්ස...... මට අගේට පුළුවනි."

රජතුමා තමන්ගේ වස්තුව රැකගන්ට ලෝභකමෙන් මේ අඥාන පුද්ගලයාව තක්සේරු නිලධාරියා හැටියට පත් කළා. එදා ඉඳලා මේ මෝඩයා හිතුමනාපේ මිල නියම කරනවා. තමන් ඒ තනතුරේ සිටිය නිසා මොහුගේ නියමය අවසන් තීරණය වුනා.

දවසක් උතුරු ප්‍රදේශයේ ඉඳලා එක්තරා අස් වෙළෙන්දෙක් අශ්වයන් පන්සියයක් අරගෙන බරණැසට ආවා. අශ්වයන් පන්සියය රජ මිදුලට ගෙනාවා. රජ්ජුරුවෝ අර මෝඩ නිලධාරියා

කැඳෙව්වා. අශ්වයන් පන්සිය දෙනාට මිලක් නියම කරන්ට කිව්වා. ඔහු ගාම්භීර ලීලාවෙන් ඔලුව හරවා අශ්වයන් දෙස බලා මෙහෙම කිව්වා.

"දේවයන් වහන්ස,.... මට පෙනෙන හැටියට.... මේ.... අස්පයන්ට වටිනාකොම මෙහෙමයි දෙන්ට වෙන්නෙ..... මේ අස්පයන් පන්සිය දෙනාගේ වටිනාකොම සහල් නැළිය යි."

අස්ස වෙළෙන්දා උඩ ගිහින් බිම වැටුනා. දැස් ලොකු වුනා. දිව ගිලුනා. දාඩිය දැම්මා. කලන්තෙ හැදුනා. කරන්ට දෙයක් නෑ. රාජකීය තක්සේරු නිලධාරියා ගේ තීරණය නොවැ. අශ්වයන් මාළිගයට ලැබුනා. සහල් නැළිය වෙළෙන්දාට ලැබුනා. වෙළෙන්දා සහල් නැළියත් අරගෙන හඬ හඬා බෝධිසත්වයන් සොයාගෙන ගියා. හැඬූ කඳුළින් විස්තරේ කිව්වා. එතකොට ඔහු වෙළෙන්දාට උපදේශයක් දුන්නා.

මිත්‍රය.... කලබල වෙන්න එපා..... ඔය තක්සේරුකාරයා මෝඩයෙක්...... ඔබ මෙහෙම කරන්න. ඔය පුද්ගලයාට මොකක් හරි තෑග්ගක් දෙන්න. දීල මෙහෙම අහන්න.

"පින්වත, මගේ අශ්වයන් පන්සිය දෙනාට ඔබතුමා එක් සහල් නැළියකට තක්සේරු කළා. ඒ වගේ ම ඔබතුමාගේ අවබෝධයෙන් ම සහල් නැළියේ වටිනාකම කීයකට තක්සේරු කරනවා ද කියල දැනගන්ට කැමැතියි. ඉතින්.... රජතුමා ඉදිරියේ මේ සහල් නැළියේ වටිනාකම මෙපමණක් ය කියල කියන්ට පුළුවන් නේද.....?"

එතකොට ඔහු අර තෑග්ග ගනීවි. රජතුමා ඉදිරියේ වටිනාකම කියන්ට පුළුවනි කියල පොරොන්දු වේවි.

අස් වෙළෙන්දා බෝධිසත්වයන් කියූ ලෙසට ම ඔහු මුණ ගැහුනා. තෑගි භෝග දුන්නා. තමන්ගේ පැත්තට නම්මවා ගත්තා. අල්ලසට යට වූ ඔහු අස් වෙළෙන්දාගේ ඉල්ලීමට සහල් නැළිය

තක්සේරු කරන්ට කැමති වුනා. එදා බෝධිසත්වයෝත් බොහෝ ඇමතිවරුත් මාළිගාවට ගියා.

අස්වෙළෙන්දා රජුට වන්දනා කළා. මෙහෙම කිව්වා.

"දේවයන් වහන්ස, පන්සියයක් වූ අශ්වයන් ගේ වටිනාකම වුනේ එක් සහල් නැළියයි. දේවයන් වහන්ස.... මේ සහල් නැළියේ වටිනාකම කොපමණක් දැයි රාජකීය තක්සේරු නිලධාරියාගෙන් අසා වදාරණ සේක්වා!"

එතකොට රජු තමා පත්කළ තක්සේරු නිලධාරියා දෙස බැලුවා.

"එම්බා තක්සේරුකාරය, පන්සියයක් අශ්වයන්ගේ වටිනාකොම කොපමණ ද....?"

"දේවයන් වහන්ස,.... සහල් නැළියකි."

"එම්බල.... එය එසේ ම වේවා. ඒ අශ්වයෝ සහල් නැළියක් ම වටිත්වා! එතකොට සහල් නැළියේ වටිනාකොම කොපමණ ද?"

"දේවයන් වහන්ස.... මේ සහල් නැළිය එසේ මෙසේ දෙයක් නොවේ. ඇතුළු නුවරත් පිටනුවරත් යන දෙකින් යුතු බරණැස් රාජ්‍යය තරම් අගනේ ය."

"මොහු කලින් රජුගේ ප්‍රශ්නයන්ට අනුව කටයුතු කිරීමෙන් අශ්වයන් පන්සියයකගේ වටිනාකම එක් සහල් නැළියක් වුනා. නැවත අස් වෙළෙන්දාගෙන් අල්ලස් ගෙන ඒ සහල් නැළිය අභ්‍යන්තර බාහිර සම්පතින් යුතු බරණැස් රාජ්‍යයට තක්සේරු කළා.

මහණෙනි..... ඒ කාලේ ඇතුළු නුවර ප්‍රාකාර වට රවුම දොළොස් යොදුනක් ප්‍රමාණයෙන් යුක්තයි. (කිලෝ මීටර් 120කි) බාහිර නගරය යොදුන් තුන්සියයක ප්‍රමාණයෙන් යුක්තයි. (කිලෝ

මීටර් 3000 කි) මෙසේ ඒ මෝඩ තක්සේරුකාරයා මේ සා සමෘද්ධිමත් බරණැස් රාජ්‍යය එක් සහල් නැළියකට තක්සේරු කළා.

මෙය ඇසූ ඇමැතිවරු හයියෙන් අප්පුඩි ගසා හිනැහෙන්න පටන් ගත්තා.

"දේවයන් වහන්ස.... අපි ඉස්සර අහලා තිබුනේ මහපොළොවත්, රජ්ජුරුවන්වත් වටිනාකම තක්සේරු කරන්ට බැහැ කියලයි... අහෝමැයි.... දැන් බැලින්නම් රජුන් සහිත බරණැස් රාජ්‍යයේ වටිනාකම සහල් නැළියයි නොවැ. අහෝ.... තක්සේරුකරුවෙකු ගේ ඥාණමහිමයේ හැටි....! මෙපමණ කල් මේ තක්සේරුකරු කොහෙදෑ හිටියේ....? අපගේ දේවයන් වහන්සේ ගේ සිතැඟි අනුව මොහු මෙහෙමද කටයුතු කරන්නේ...?"

රජ්ජුරුවන්ගේ මූණ ලැජ්ජාවෙන් රතු වුනා. කරගන්ට දෙයක් නෑ. වහාම ඒ මෝඩයාව ඉවත් කළා. බෝධිසත්වයන්ට ඒ තනතුරු පැවරුවා. ඒ කාලෙ ලාලුදායි තමයි ඒ මෝඩ වැඩේ කළේ.

පින්වතුනේ, පින්වත් දරුවනේ,

මේ ජීවිතයේ දී අපිටත් ඕනෑම දෙයකට නිසි වටිනාකම තක්සේරු කරලා දැනගන්ට හැකියාව තියෙන්න ඕනා. දැක්ක නේ.... ලාලුදායි තෙරුන්ට වූ දේ... මව්පියන්ගේ වටිනාකම, ගුරුවරුන්ගේ වටිනාකම දැනගන්ට ඕනා. ඒ වගේ ම සුළු දෙයක් නමුත් අපි පරිහරණය කරන දේ ගැන පවා වටිනාකම දැන ගන්ට ඕනා. එහෙම නොවුනොත් රජුන් සහිත බරණැස් රාජ්‍යය සහල් නැළියකට තක්සේරු කළ මෝඩ පුද්ගලයාට වූ දේ අපටත් වේවි.



# පින, උත්සාහය
# සහ
# නිවැරදි ප්‍රතිපදාව

පින්වත් දුවේ පුතේ,

''**උත්සාහවන්තයා ජය ගනී**'' කියා අප අසා තිබෙනවා. උත්සාහවත් මිනිසුන් ලෝකයේ සාර්ථකත්වයට පත් වූ අවස්ථාවන් ගැන ද අප අසා තිබෙනවා. සැබැවින් ම උත්සාහය කියා කියන්නේ පැසසුම් ලැබිය යුතු දෙයක්. තමන් තුළ පවතිනවා දකින්නට කැමැති විය යුතු දෙයක්.

හැබැයි දුවේ පුතේ, උත්සාහ කළ පමණින් ම සියල්ලෝ සාර්ථකත්වයට පත් වන්නේ නැහැ. ඒ සඳහා සසරේ රැස් කළ පින් මහිමයත් බලපානවා. වාසනා ගුණයක් බවට පත් වෙලා සසර පින සැප සලසාලද්දී එයින් සාර්ථකත්වය වෙත යන්නට ලැබෙන්නේ ලොකු උපකාරයක්.

එහෙනම්... පිනත්, උත්සාහයත් තිබෙනවා නම් මිනිසෙකු සාර්ථකත්වයට පත්වෙනවා ද? නැහැ. එපමණකිනුත් මිනිසෙකු සාර්ථක වන්නේ නැහැ. එයට වුවමනයි නිවැරදි ප්‍රතිපදාවක්. ඒ කියන්නේ හරි මාර්ගයේ ගමන් කිරීමක්.

අපගේ ශාස්තෘවර ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ සම්බුදු සසුනේ දකුණත් ශ්‍රාවකයාණන් වහන්සේ වුණ, සම්බුද්ධ රාජ්‍යයේ ධර්ම සේනාධිපතීන් වහන්සේ වුණ, රන්වනින් බැබළෙන අභිරූපී කාය ශෝභාවක් ද සහිත වුණ සාරිපුත්ත මහරහතන් වහන්සේ සසරේ බොහෝ පින් කෙරූ උත්තමයෙක්. සම්බුදු සසුනක අග්‍ර ශ්‍රාවකයාණන් වහන්සේනමක් ව සසරින් එතෙර වන්නට පොඩි පිනකින් බැහැ. ඒ සාරිපුත්ත මහරහතන් වහන්සේ හරී ම ප්‍රඥාවන්තයි. උන්වහන්සේට කල්පයක් තිස්සේ මහ මුහුදට වැටෙන වැහි බිඳු ගණන පවා කියන්නට පුළුවනි. ඥාණවන්ත බවින් ගෞතම සම්බුදු සසුනේ අග තනතුරු ලැබූයේ ද සාරිපුත්ත මහරහතන් වහන්සේ ම යි. ඒ කියන්නේ, සැක රහිතව ම උන්වහන්සේ බොහෝ පින් තිබූ උතුමෙකු බව අපට කියන්නට පුළුවනි.

ඒ වගේ ම යි දුවේ පුතේ මහා මොග්ගල්ලාන මහරහතන් වහන්සේගේ පින් මහිමයත්. ඍද්ධි බල මහිමයෙන් උන්වහන්සේ ගෞතම සම්බුදු සසුනේ අග තනතුරු ලැබුවා. නිල් මහනෙල් මලේ වැනි සොඳුරු පැහැයෙන් බැබළුන ඒ උතුම් මුනිවරයාණන් වහන්සේ තමන් වහන්සේගේ ඍද්ධි බලය ප්‍රකට කරවමින් මහපට ඇඟිල්ලෙන් සක් දෙවිඳුගේ වෛජයන්ත ප්‍රාසාදය සැඩ කුණාටුවකට හසු වූවාක් පරිද්දෙන් සොලවාලූවා.

කෝලිත උපතිස්ස දෙමිතුරන්ගේ පුවත දූලා, පුතාලා හොඳින් ම දන්නවා. ඒ දෙදෙනා ගිරග්ග සමජ්ජ නම් වූ සැණකෙළිය නරඹන්නට ගොස් එවැනි නැටුම් කෙළි කවටකමින් ජීවිතයට යහපතක් නොලැබෙන බව තේරුම් අරගෙනයි ගිහි ගෙදරින් නික්මුණේ. ඒ මොහොතේ පටන් ඔවුන් දෙදෙනා ම උත්සාහවත් වුණේ ජීවිතයට යහපත සැලසෙන, අර්ථය සැලසෙන මාර්ගය සොයා ගැනීමට යි. සංජය පිරිවැජියා සමීපයේ උගනිද්දී පවා ඔවුන් සෙවූ ඉලක්කය එය යි.

ඒ සා පින්වත් වූ, ඒ සා උත්සාහවත් වූ ඒ දෙදෙනාට ඔවුන් සොයා ගිය විමුක්තිය සංජය පිරිවැජියා සමීපයේ දී මුණගැසුණේ නැහැ. එයට හේතුව නම්, සංජය යනු නිවැරදි මග නොදත් පැවිද්දෙකු වීම යි. නිවැරදි මග දත්, එමගෙහි පරතෙර දුටු අස්සජි මහරහතන් වහන්සේ මුණගැසී අසන්නට ලැබුණු සතරපද ගාථාවේ පළමු දෙපදය ඇසෙද්දී ම උපතිස්ස පිරිවැජියා ඒ තාක් වෙහෙස වී සෙවූ විමුක්ති මාර්ගයේ පිහිටියා. ඒ ගාථාවේ සතරපදයන් අසත් ම කෝලිත පිරිවැජියාත් විමුක්ති මාර්ගයේ පිහිටියා. ඒ තමයි දුවේ පුතේ, පිනත්, උත්සාහයත්, නිවැරදි ප්‍රතිපදාවත් එක්තැන් වූ විට ලැබෙන ප්‍රතිඵලය...

ඒ ගැන ලස්සන උපමාවන් කිහිපයක් සම්බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ මුණගැසෙනවා. උත්සාහය හා නිවැරදි ප්‍රතිපදාව ගැන එක්තරා අවස්ථාවක සම්බුදුරජාණන් වහන්සේ මෙසේ පෙන්වා දෙනවා. ඔන්න එක්තරා කිකිළියක් සිටිනවා.

ඇය බිත්තර දමනවා. නමුත් ඒ බිත්තර රකින්නේ නැහැ. උණුසුම් කරවන්නේ නැහැ. කුකුළු ගඳ ගස්සවන්නේ නැහැ. බිත්තර දැමීම ම පමණක් කළ ඒ කිකිළිය 'පැටව් ලැබේවා!, පැටව් ලැබේවා!' කියා කොපමණ කෑ ගැසුවත්, පැතුවත් ඒ බිත්තරවලින් පැටව් බිහි වන්නේ නම් නැහැ. කයිවාරු ගැසීමෙන් ඒ දේ කළ නොහැකියි. එය නිවැරදි ප්‍රතිපදාව නොවෙයි.

තවත් කිකිළියක් ඉන්නවා. ඇයත් අර කලින් කියපු කිකිළිය වගේ ම බිත්තර දානවා. නමුත් මේ කිකිළිය ඒ බිත්තර රකිනවා. උණුසුම් කරවනවා. කුකුළු ගඳ ගස්සවනවා. මේ කිකිළිය 'පැටව් ලැබේවා!' කියා කීවත්, නොකීවත්, කෑ ගැසුවත් නැතත්, පැතුවත් නැතත් ඒ බිත්තර පුපුරා යම් දිනෙක පැටවුන් එළියට එනවා. ඒ තමයි නිවැරදි ප්‍රතිපදාව.

කිරි ලබා දෙන එළදෙනක් සිටිනවා. ඇය සමීපයට යන්නෙකු ඇයගේ අං තට්ටුවෙන් අදිමින් කිරි දෙවන්නට උත්සාහ කරනවා. මෙසේ කොපමණ වීරිය කළත් ඔහුට කිසි කලෙක කිරි ලබන්නට නොහැකියි. එය නිවැරදි ප්‍රතිපදාව නොවෙයි. යම් මොහොතක ඔහු භාජනය ගෙන එළදෙනගේ තන බුරුල්ල යටින් තබා තන පුඩුවලින් කිරි දෙවන්නට පටන් ගන්නවා ද එයින් නම් ප්‍රතිඵල ලැබෙනවා. ඒ තමයි නිවැරදි ප්‍රතිපදාව. දුවේ පුතේ, ධර්මය සම්බන්ධයෙන් පමණක් නොවෙයි එදිනෙදා ජීවිතය සම්බන්ධයෙනුත් මේ කාරණය පොදුයි.

නොයෙක් ක්‍රමවලින් සාර්ථකත්වය අත්පත් කර ගන්නට උත්සාහ කරන්නවුන් තමයි අප අතරත් සිටින්නේ. මේ රටේ නැකැත්, නිමිති, කේන්දර වැනි දේ ඔස්සේත්, දේවාල සාස්තර ආදියෙනුත් නොයෙක් පිළිවෙත්වල යෙදෙමින් දියුණුව සොයා නොගිය අය අප අතර සිටිනවා නම් ඒ ඉතාමත් අඩු පිරිසක්. නමුත් ඔවුන් සෙවූ පමණින් සෙවූ තරමින් දියුණුවක් නම් ලද බවක් පෙනෙන්නට නැහැ.

ඒ බව බොහොම පැහැදිලි ව දකින්නට හැකි නිදසුනක් දුවට පුතාට අප සිහිපත් කර දෙන්නම්. අප්‍රේල් අවුරුදු සමයේ මුළු රටක් එක ම වේලාවක් සුභ නැකැත ලෙස ගනිමින් ළිප ගිනි මොළවා වැඩ අල්ලා කැවුම් කිරිබත් කා සාමය සෞභාග්‍යය සතුට සපිරි අවුරුද්දක් ප්‍රාර්ථනා කළා. එයින් සතියක් ඉක්ම යද්දී මුළු රට ම මළ ගෙයක ස්වභාවයකට ඇද දැමූ ම්ලේච්ඡ ත්‍රස්තවාදී ප්‍රහාරයකට මුහුණ දෙන්නට අපට සිදු වුණා. මේ වන තෙක් එයින් පසු ඇති වූ අවිනිශ්චිත වටපිටාව දුරු වී නැති බව පැහැදිලි ව දකින්නට පුළුවනි. රට සාමාන්‍ය තත්ත්වයට පත්ව ඇතැයි කවුරුන් කීවත් පසුගිය දළදා පෙරහැර සමයේ පෙරහැර නරඹා උතුම් බුදු පුද අනුමෝදන් වන්නට පැමිණි ලාංකිකයන් පිරිස අන් වසරවලට වඩා බොහෝ අඩු වීම රට තවමත් සාමාන්‍ය තත්ත්වයට පත්ව නැති බව පෙන්වා දුන්නා. ඉතින් මුළු රටක් නැකැත් පිළිපැද්දා කියා ලැබුණු යහපත මෙය ද?

දුවේ පුතේ, නැකැත් කේන්දර නිමිති ජ්‍යෝතිෂ්‍යය යනාදී සියල්ල අපරිපූර්ණ ශිල්පයන් පමණයි. ඒ අනුව ම කටයුතු කොට ජය ගත් කිසිවෙකුත් ලෝකයේ නැහැ. තරඟකාරී අවස්ථාවල දී බොහෝ දෙනා මේ දේවලින් බොහෝ පිහිට සොයනවා. යදිනවා. නමුත් නොසිතූ විරූ ලෙසින් ඔවුනට සිතූ පැතූ දේ අහිමි වන බව අප දකිනවා. පිහිටක් සලසන්නට නැකැතට, කේන්දරයට හැකි නම්, ඔවුනට වැරදුනේ ඇයි? ඔවුන් පැරදුනේ ඇයි? ඒ, ඔවුන් බාහිර පිහිට පිළිසරණ සෙව්වා මිස නිවැරදි ප්‍රතිපදාව තුළ උත්සාහවත් නොවුණ නිසයි...

බාරහාර පුදපූජා ප්‍රාර්ථනා යැදීම් ආදියෙන් දිනන්නට හැකි යමක් ලෝකයේ වේ නම් කාට නම් මොනවා නොලැබෙන්න ද? බාරහාර පුදපූජා වැනි දෙය හා සම්බන්ධ භූත ප්‍රේත යක්ෂ ආදී අමනුෂ්‍යයන් විසින් යම් යම් උපකාර සලසා තාවකාලික දිනුමක් ලබන්නට උපකාර සැලසෙන අවස්ථා නොතිබෙනවා නෙවෙයි. හැබැයි ඒ සියල්ල මතු ජීවිතවල ඒ අමනුෂ්‍යයන්ගේ දාසයන් බවට අප පත් කරවන්නට හේතු වන ගනුදෙනු බවට යි පත් වන්නේ.

මෙහෙම හිතන්න. දුවට පුතාට තරඟකාරී විභාගයකට මුහුණ දෙන්නට සිදු වෙනවා. ඒ වෙලාවෙදි ඔබ වෙනුවෙන් දේවාල වෙත ගොස් පඬුරු වෙන් කොට කවුරුන් හෝ බාරහාර වෙනවා. එහෙමත් නැති නම්, කේන්දර බලා යන්ත්‍ර ආදිය පලන්දනවා. එහෙමත් නැති නම් ජීවම් කළා යැයි කියා ලියන්නට පෑන් පැන්සල් ආදිය ලබා දෙනවා. ඒ සියල්ල කළත් දුව පුතා පාඩම් කළේ නැති නම්, හොඳින් උනන්දුවෙන් අධ්‍යාපන කටයුතුවල යෙදුණේ නැති නම්, විභාගයට සූදානම් වුණේ නැති නම් ඔබට සාර්ථක ව ඒ අභියෝගය ජය ගන්න පුළුවන් වේවි ද? කිසිසේත් ම බැහැ. හැබැයි ඔබ එය ජය ගත්තත්, නොගත්තත් ඔබ සම්බන්ධයෙන් බාරහාර වී ගනුදෙනු හද ගත් අමනුෂ්‍ය පිරිස ඊට පස්සේ ඔබ ව අත්හරින්නේත් නැහැ. අද වෙනකොට රටේ සිදුවන බොහෝ රිය අනතුරු හා සම්බන්ධ ජීවිත හානිවලට එක් හේතුවක් තමයි මෙසේ නොයෙක් අවස්ථාවල දී 'ජීවිතයට ජීවිතයක්' ආදී වශයෙන් කියමින් බාරහාර වීම. අවසානයේ මරණ මොහොතෙදිත් ඒ අමනුෂ්‍යයෝ තමයි ළං වෙන්නේ. මේ දුර්ලභ ව ලැබුණු මනුෂ්‍ය ජීවිතේ අප එවැනි අවාසනාවන්ත ඉරණමක් ද උරුම කර ගත යුත්තේ? දුවේ පුතේ, ඔබ එවැන්නකට කිසිසේත් ම කැමති වන්නට එපා. එය සම්බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයනට සුදුසු දෙයක් නෙමෙයි, ගැළපෙන දෙයක් නෙමෙයි.

ලෝකයේ අපට සරණ තිබෙන්නේ සම්බුදුරජාණන් වහන්සේ ළඟ යි, ඒ උතුම් ශ්‍රී සද්ධර්මයේ යි, ආර්ය මහ ශ්‍රාවක සඟ රුවන වෙතයි... "බුද්ධං සරණං ගච්ඡාමි! ධම්මං සරණං ගච්ඡාමි! සංඝං සරණං ගච්ඡාමි!" කියා අප සමාදන් වන්නේ ඒ උතුම් සරණ සීලය යි. සමාදන් වන සිල්පද සේ ම මේ උතුම් සරණ සීලයත් අප ආරක්ෂා කර ගත යුත්තේ බොහෝ ම ගෞරවයෙන්. ඒ සරණ සීලය කිලිටි කරලන නැකැත්, නිමිති, කේන්දර, දේවාල, සාස්තර ආදියෙන් පිහිට සොයන්නට යන්න එපා. ඔබ සිල්වත් වෙන්න. ගුණවත් වෙන්න. නිරන්තරයෙන් පින්දහම් රැස් කරන්න. අලස නැති, කුසීත නැති උත්සාහවත් දරුවෙක් වෙන්න. අප සරණ ගිය ශාස්තෘන්

වහන්සේ ලෞකික ව පවා සියලු දියුණුවට පත් වන ආකාරය අප කෙරෙහි අනුකම්පාවෙන් යුතුව පෙන්වා දීලයි තිබෙන්නේ. සරණ රැකගත් සම්බුදු ශ්‍රාවකයෙක් ව ඒ ආකාරයෙන් කටයුතු කළොත් අප මේ සටහනට තේමාව කර ගත් 'පින, උත්සාහය සහ නිවැරදි ප්‍රතිපදාව' අප තුළ වැඩී යනවා. ඒ උතුම් ලාභය ලැබූ කෙනෙක් දියුණුව ම යි කැමති විය යුත්තේ.

භාග්‍යවතුන් වහන්සේ ව සරණ ගිය, සිල් ගුණදම් රකින, වීරියෙන් හීන නැති සම්බුදු ශ්‍රාවකයන්ට දෙවිවරුන්ගේ ද උපකාර ලැබෙනවා. මඟතොටේ අනතුරු වළකාලන, සතුරු විපත් නසන, සුව සේ කටයුතු ඉටු කර ගන්නට උපකාරක වන ඉෂ්ට දේවතා අනුග්‍රහය ලැබෙන්නේ ද ඒ අයට ම යි. එවැනි අය මේ ජීවිතය ජය ගන්නවා. පරලොව ද සුගතිය දිනනවා. නිවන් මගේ ද ඉදිරියට යනවා. අප කාගේත් ඉලක්කය විය යුත්තේ එය නේ ද?

නොයෙක් මිථ්‍යාවන්ගෙන් වැසී ගත් ලෝකයේ ඒ අවිද්‍යා අන්ධකාරය නසා නැගුන තෙදවත් හිරු මඬල තමයි සම්මා සම්බුදුරජාණන් වහන්සේ. උන්වහන්සේ සරණ ගිය අප කිසි කලෙක මිථ්‍යාවක සරණ සොයන්නවුන් නොවිය යුතු යි. එය හොඳින් සිතට ගන්න. අපට තිබෙන්නේ තෙරුවන් සරණ ම පමණ යි. පෙනෙන, නොපෙනෙන අන් කිසිවක් අපට සරණ නො වෙයි...

ඒ උත්තම සරණ සීලය මැනැවින් රැකගෙන, පින් මහිමයෙන් වැඩී යමින්, උත්සාහවත් ව ජීවිතයේ සියලු දියුණුවට පත් වන්නට පින්වත් දුවට, පුතාට තෙරුවනේ ආශීර්වාදය වේවා! ඔබ සියලු දෙනා ම සුවපත් වේවා! සියලු සැපයට පත් වේවා!


තෙරුවන් සරණයි!

# නිර්මාණ ඉසව්ව


පැදියෙන් සිතුවමින් නිසඳැසින්
සුසැදි ඔබේ නිර්මාණ එකතුව




11 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඒ.පී. සඳුනි හංසිකා දියණිය විසින් එවූ නිර්මාණයක්...




10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ජේ.පී. උදාරි වත්සලා දියණිය විසින් එවූ නිර්මාණයක්...




12 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඩී.එම්. ඉමේෂා ජයමාලි දියණිය විසින් එවූ නිර්මාණයක්...



10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන දිල්මි නිකේෂලා දියණිය විසින් එවූ නිර්මාණයක්...




07 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන කේ.එම්. කාවින්දයා සෙව්වන්දි දියණිය විසින් එවූ නිර්මාණයක්...



එච්.ආර්. හෂිනි මදුෂිකා දියණිය විසින් එවූ නිර්මාණයක්... 2019 A/L



08 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබනතක්ෂිලා සඳුනි රූපසිංහ දියණිය විසින් එවූ නිර්මාණයක්...



10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ආර්.එම් ශානුක කෞෂල්‍ය පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...





10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන එච්.එම්.ඩී. කාවින්ද්‍යා හේරත් දියණිය විසින් එවූ නිර්මාණයක්...




10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන කාවින්ද්‍යා චමෝදි ජයතිස්ස දියණිය විසින් එවූ නිර්මාණයක්...



13 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන එච්. කේෂානි නිමන්තිකා ධර්මරත්න දියණිය විසින් එවූ නිර්මාණයක්...



09 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන එන්.ජී. ධනංජ ඉසුරු උදාර පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...



13 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන කාවින්ද්‍යා සෙව්වන්දි නවරත්න දියණිය විසින් එවූ නිර්මාණයක්...



09 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ආර්.ජී. රුවන්තිකා මදූෂානි දියණිය විසින් එවූ නිර්මාණයක්...




07 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඩී.එම්. නෙත්මි ශෂිකලා සෙව්වන්දි දියණිය විසින් එවූ නිර්මාණයක්...



10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන අමන්දි දියණිය විසින් එවූ නිර්මාණයක්...



10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඩී.ජී.ඩී. සාරංග සදීප් පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...



07 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන පී.ඩී.එල්. චරිත් ජීවන් පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...



08 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන චේතමී වාසනා දියණිය විසින් එවූ නිර්මාණයක්...

# ජීවත් වන තුරා...

පැමිණි අරමුණ නො දන ඉන්නේ
උවමනා නැති වැඩ කරන්නේ
අනුනට ම ඇයි දොස් නගන්නේ
කවදා ද අපි නිදොස් වන්නේ

මිනිසුන් වුවත් තිරිසන් වැඩ කරන නිසා
දෙසුවේ දහම් අපහට අප සෑසි පියා
එය අසනා මිනිසුන් අද ඇතැයි කියා
සිතුවට මදි අපි දන්නවා ඇතැයි කියා

පණ ඇති සතුන් අපි දැඩි ලෙස නසමින්නේ
නොදුන් දෙයක් අපගේ ලෙස ගනිමින්නේ
රාගය මුසුව බොරු පද ටික ගොතමින්නේ
සුරා මතින් කොහොමැයි නිවනට යන්නේ

තේරුම් ගන්න අප හැම වීරිය කරමු
පස් පව් අපේ දිවියෙන් අපි තොර කරමු
හෙට ලෝකයත් මෙලෙසින් අපි ගොඩ නඟමු
වහ වහා නිවන් මඟ වැඩුමට අපි පතමු

11 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන කේ. ශානිකා මධුෂානි මුණසිංහ දියණිය විසින් එවූ නිර්මාණයක්...

## පොසොන් උත්සවය...

පායා පොසොන් සඳ ඇතින් නැගෙන විට
වනමල් සුවඳ විහිදයි පෙති පුබුදු කොට
අනුබුදු මිහිඳු හිමි වැඩි ඒ පොසොන් දින
හද පිරි බැතින් අම දම් පද අසමි මම

නිල් අහසෙහි සෙමින් පුර සඳ මල පූදී
මල් පෙති පොපියවයි සඳ වතුරට සේදී
මුලු ලොව දුක නිවූ බලයෙන් මිහිඳු හිමි
ඔබ හට පොසොන් දින දෙයි සම්පත් පෑදී

අඳුරේ අහසෙ සඳ කැල්මන් එකලු වෙලා
අනුබුදු මිහිඳු හිමි සදහම් තිළිණ කළා
පවනත් සමඟ හද බැතිමල් සුවඳ නෙලා
සැනසෙමු අපිත් භව බැම් බිඳ එතෙර වෙලා

අනුබුදු මිහිඳු හිමි සදහම් පහස විඳ
මම වැඳ වැටෙන්නෙමි නළලෙහි දෑත බැඳ
ගණඳුර ඉරා නැඟ එන කල පොසොන් සඳ
සැනසුම පතමි හිතවත් මව්පියනි අද

09 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඩබ්.එම්. සොනාලි කාවින්ද්‍යා දියණිය විසින් එවූ නිර්මාණයක්...

## නමදිමි ඔබ දෙපා...

නැණ නුවන පාදවා
දිවි ගමන එළිය කරන්නට
මා වෙනුවෙන්
ඇප කැප වී සිටින
කැපකරු මව් පියාණෙනි,
නමදිමි ඔබ දෙපා.

හමු වුණොත් යම් දිනෙක
පුදමි මල් මිටි තබා
හද බැතින් ඔබ දෙපල.

අනේක විද බාධක මැද
ගෙවන මේ ජීවිතය ජයගන්නට
මේ කරන උපකාරයට
සදා ණයගැතියි මා ඔබට.

13 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන එස්.ජේ.ජී. දක්ෂි කෞෂල්‍යා දියණිය විසින් එවූ නිර්මාණයක්....

## කැපකරු මව්පියන් වෙත....

අනේක දුක් කම්කටොලු මැද
උපයාගත් මුදල්
තුටු සිතින් ම
ජීවිතය ජයගන්නට වෙර දරන
දූයේ අපවන් දූ පුතුන්ට
මහත් සෙනෙහසින් දායාද කරන
දයාබර කැපකරු මව්පියවරුනි,
මා රැස් කළ පින් මහිමයෙන්
ඔබ සැමට
නිවන් පිණිස ම හේතු වෙත්වා!
මගේ ආයුෂත් ගෙන
සැමදා සුවසේ ජීවත් වෙත්වා!

13 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන එස්.ජේ.ජී. දක්ෂි කෞෂල්‍යා දියණිය විසින් එවූ නිර්මාණයක්....

## ජීවිතය දිනූ දා...

ජය කණුව බෝ දුරයි
නමුදු ළංවිය හැකී...
එයට ළං වෙන්න නම්
"දැනුම්" නිරුදක කතර
තරණය ම කළ යුතුයි...
සා පිපාසා දැනේවි
එහෙත් එය මැඩ ගනින්
ජය කණුව අභියසදි
ජය පැනින් තුටු වෙයන්...
එය අපේ යුතුකමයි
අදිටනින් පෙරට යමු
දුක් කඳුළු පසෙකලා...
හිතට දිරි එඩි වඩා
යා යුතුය ඉදිරියට
නැණ පහන් දල්වලා
එමඟ ගොස්...
ජීවිතය දිනූ දා
ඔබ සමඟ එක් වෙමින්
තුටු කඳුළු සළන්නට
මඟ බලා හිඳිනවා
සදා අදරැති ඔබේ,
මා පියන්...

11 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඩබ්.ජේ. අචිනි නිසංසලා දියණිය විසින් එවූ නිර්මාණයක්....

## බුදු හිමියනි....

සිලි සිලියේ සිනා සලන බෝ පත් අතරේ
මහමායා මවුකුස බෝසතු පිළිසින්දේ
අමා දහම් ගඟුලෙන් ලෝකය නැහැවූයේ
ඔබමයි බුදු සමිඳුනි අප සිත් එළිය කළේ

සසර කතර සමුදුරෙ දන ගිලී මියෙනවා
ඒ මිනිසුන් බේරගන්න හිමි කැප වෙනවා
නව අරහාදී බුදුගුණ දසත පතුරලා
නිවනට යන මඟ සතහට පෙන්වා දෙනවා

මුලා නොවන සදහම් මඟ කියලා දෙනවා
සමිඳු අඳුරු හදවත් හැම එළිය කරනවා
සසර කතර එතෙර වන්න මඟ පාදනවා
බුදු හිමියනි බොදු දන හැම ඒ මඟ යනවා

08 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඒ.එම්. ගවීනා අත්තනායක දියණිය විසින් එවූ නිර්මාණයක්....

## සිත සනසන බුදු ගුණ...

නින්දා අපහාස පරිභවයන් ආවත්
යම් යම් කෙනා බොරුවට යම් දේ කීවත්
බාධක චෝදනා හිරිහැරයන් වූවත්
බුදුගුණ බලය අඩුවක් නැහැ කවදාවත්

තුරුහිස නටන මල් මුවරද සුවඳ අරන්
සිසිලස ගලයි වෙහෙරට බුදු සමිඳු සොයන්
සුවඳෙන් සපිරි සුදු අරලිය පොකුරු දරන්
අපි පිය නඟමු ඒ මග දිග නිවන සොයන්

08 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන කේ. දිනෙත්‍රා ඖෂධ පුතණුවන් විසින් එවූ නිර්මාණයක්....

# බේබද්දෝ…

පුංචි කාලේ කැලේ පැනලා
හුරු වුණා බේබද්දෝ
නිවනක් නැති ප්‍රශ්න කඳට
විසඳුම් සොයන්නට
හුරු වුණා බේබද්දෝ
තුරුණුවියට, බොළඳකමට,
සොමියට, කික් එකට
හුරු වුණා බේබද්දෝ
නරුමයින්ගේ මිච්ඡාවට
හසුවුණා බේබද්දෝ
තමා වැඩ්ඩෙක්ය,
සිතාගත් බේබද්දෝ....

දුකට, සතුටට
විනෝදයට
මඟුල් ගෙදරට, මළගෙදරට
රජයයි බේබද්දෝ....

පුංචි පරෙවි කැදැල්ලට
උලමා හඬයි බේබද්දෝ
අම්මා, තාත්තා
බිරිඳ, දුවණියා
නො හඳුනයි බේබද්දෝ....

මිහිරි වදන් කෝ දැන් තොපගේ
පරුෂ වචන දැන් වරුසන්නේ
සිනහව පිරි දෙසවන් තුළ ඇයි?
හැඬුම් රිදුම් දැන් ඉකිබිඳින්නේ....

මෙලොව සුරපුරයකි,
එලොව අපා ලෝකයක්,
දෙ ලොව බේදවාචකයකි....

තිරිසන්ගත
මිනිසුන්ට
නො තේරෙයි ද?
බේබද්දෝ....

විශ්ව විද්‍යාලයේ ඉගෙනුම ලබන ආර්.ඒ. දිනූෂා කුමාරි දියණිය විසින් එවූ නිර්මාණයක්....

## එයයි හදේ පැතුම නිතින්....

ජීවිතේ මාවතක් නම්,
අපි එහි ඇවිද යන
පදිකයන් වෙමු...

ජීවිතේ ගීතයක් නම්,
අපි එහි තනුව වෙමු...

සංසාර සාගරේ,
නැවතී සිටිනා
මේ ගිමන්හලේ,
සසර පුරුද්දට
හමු වූවා ඔබ මා හට...

මාගේ ඉගෙනුම පිළිබඳ
නිති සොයා බැලුවා
දුර ඈතක සිට ඔබ,
මෑණියනි, පියාණනි...

නො දැක ඇති මුත් අප,
හැඟෙයි දන්නා හඳුනනා වග
නො දනිමි කිම ලෙස
තුති පුදන්නට ඔබහට
කරනා මේ උපකාරය හට...

මේ සංසාර සාගරේ,
නිමක් නැති දුක් කඳ දුරලා,
උතුම් නිවන් මඟ යන්නට
හැකිවේවා! ඔබ හට,
එය යි හදේ පැතුම නිතින්,
සෙනෙහෙබර
මෑණියනි, පියාණනි...

ටී.එම්. තනූජා දිල්රුක්ෂි දියණිය විසින්
එවූ නිර්මාණයක්.... 2019 A/L

---

ලොවකි මෙය පියුම් ඇති විල්තෙරක් වැනි
පිබිදේ පියුම් සැණෙකින් හිරු රැස් වැටී
එලෙස ම බුදු සව්වෝ මග එල ම දකී
එතෙරව ඝෝර සසරින් නිවන් සුව විඳී

ඇතේ නෙළුම් මඩ තුළ හිරු කිරණ නො විඳී
පිපෙනු නැතේ එය සැණෙකින් හිරු රැස් වැටී
සිටී නොමිනිසුන් එලෙස ම අවිදුවේ ගැලී
ඔවුනට කිසිදා අරහත් මග යෑමට බැරී

රුදුරුය බියකරුය නිරයේ ගිනි
නැත එහි සැපක් මේ මනුලොව වැනි
එබැවින් පින් කරමු ඉක්මනට හැකි
ගොඩවෙමු නිවන් පුරට නැති රුදුරු ගිනි

08 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන චතුමිකා යසාරා දියණිය විසින් එවූ නිර්මාණයක්....

## වෙසක් පැතුම...

සදහම් ගඟුල මෙත් සිසිලස ලොවට බෙදූ
මනහර අමා දම් දෙසමින් සෙත සැදූ
කරුණා ගුණය උතුරන මහ සයුර බඳූ
නමදිමි බැති සිතින් තිලොවග සමිඳු බුදූ

සදහම් සුවය ගෙන දී මුළු ලොවට අගේ
දිදුළන තරු අතර පුන් සඳ මඬල වගේ
දෙසමින් ලොවට ජීවිතයක තිබෙන රගේ
නමදිමි අම දම් දුන් බුදු සමිඳු මගේ

නිර්මල දම් ඔසුව දෙසමින් සතර අතේ
වැඩි බුදු සමිඳු නො බලති තම වෙහෙස ගතේ
සුවාසූ දහස් දම් කඳ පිළිවෙලිනි සිතේ
අලුයම ලොව බළති බැතිබර කුළුණු මෙතේ

මෝහයෙන් මුලා වී තණ්හා පොදිය බැඳ
රාගයෙන් දැවි සංසාරේ අතර මැද
සිටිනා මිනිසුන් අකුසල් කරන ලද
හදපිරි බැතින් දහමෙහි සැරිසරමු අද

විශ්ව විද්‍යාලයේ ඉගෙනුම ලබන ජී.ආර්. නිමායා ප්‍රියමාලි
දියණිය විසින් එවූ නිර්මාණයක්....

අරුත් තේරුම් ගනිමින් සුමිහිරට සජ්ඣායනා කරන්න.

## කරණීයමෙත්ත සූත්‍රය

01. කරණීයමත්ථකුසලේන
යං තං සන්තං පදං අභිසමෙච්ච
සක්කෝ උජූ ච සූජූ ච
සුවචෝ චස්ස මුදු අනතිමානී

නිවනට යන මග සිටින පතා ගෙන
ඇද නැති බව සිත තුළ රඳවා ගෙන
සුවච සුමුදු ගුණ ඇති කරවා ගෙන
කළ යුතු ම ය අතිමාන නසා ගෙන

02. සන්තුස්සකෝ ච සුභරෝ ච
අප්පකිච්චෝ ච සල්ලහුකවුත්ති
සන්තින්ද්‍රියෝ ච නිපකෝ ච
අප්පගබ්භෝ කුලේසු අනනුගිද්ධෝ

සතුටු ව ලද දෙයකින් සුව සේ හිඳ
අඩු කොට වැඩ නිති සැහැල්ලුවෙන් ඉඳ
දමනය කළ ඉඳුරන් ද නුවණ මැද
හිත මිතුරුව කුලයේ නො ඇලෙන සඳ

03. න ච ඛුද්දං සමාචරේ කිඤ්චි
යේන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං
සුඛිනෝ වා ඛේමිනෝ හොන්තු
සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා

නුවණැතියන් ගෙන් දොස් නො ලබන්නේ
සුළු වරදක් හෝ නොම කරමින්නේ
බිය නැති සැප ඇති දිවි පතමින්නේ
සියලු සතුන් හට මෙත් පතුරන්නේ

**04.** **යේ කේචි පාණභූතත්ථි**
**තසා වා ථාවරා වා අනවසේසා**
**දීඝා වා යේ මහන්තා වා**
**මජ්ඣිමා රස්සකාණුකථූලා**

බියපත් තැති ගත් සතුන් ද වේවා
බිය සැක දුරු කළ රහතුන් වේවා
ලොකු පොඩි දිග මහ සතුන් ද වේවා
සැමට සැපත ඇති සිත් ඇති වේවා

**05.** **දිට්ඨා වා යේව අද්දිට්ඨා**
**යේ ච දූරේ වසන්ති අවිදූරේ**
**භූතා වා සම්භවේසීවා**
**සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා**

පෙනෙන නො පෙනෙනා සතුන් ද වේවා
දුර ළඟ වසනා සතුන් ද වේවා
ඉපදුන-ඉපදෙන සතුන් ද වේවා
සැමට සැපත ඇති සිත් ඇති වේවා

**06.** **න පරෝ පරං නිකුබ්බේථ**
**නාතිමඤ්ඤේථ කත්ථචි නං කඤ්චි**
**බ්‍යාරෝසනා පටිඝසඤ්ඤා**
**නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය**

කිසිවෙක් කිසිවෙකු නොම රවටාවා
කිසි තැනක දි ඉහළින් නො සිතාවා
නපුරු දරුණු බස් නොම පවසාවා
අනෙකෙකුගේ දුක කැමති නො වේවා

**07.** **මාතා යථා නියං පුත්තං**
**ආයුසා ඒකපුත්තමනුරක්ඛේ**
**ඒවම්පි සබ්බභූතේසු**
**මානසං භාවයේ අපරිමාණං**

තම දිවි සම කොට පුතු සුරකින්නේ
එක ම පුතෙකු ඇති මව් විලසින්නේ
මෙලෙසට ලොව සැම සතුන් දකින්නේ
අපමණ මෙත් සිත ම ය පතුරන්නේ

**08.** **මෙත්තං ච සබ්බ ලෝකස්මිං**
**මානසං භාවයේ අපරිමාණං**
**උද්ධං අධෝ ච තිරියඤ්ච**
**අසම්බාධං අවේරං අසපත්තං**

සියලු ලොවට එක ලෙස සලකන්නේ
උඩ-යට-සරසට හැම විලසින්නේ
වෛර සතුරු බාධා නැති වන්නේ
අපමණ මෙත් සිත ම ය පතුරන්නේ

**09.** **තිට්ඨං චරං නිසින්නෝ වා**
**සයානෝ වා යාවතස්ස විගතමිද්ධෝ**
**ඒතං සතිං අධිට්ඨෙය්‍ය**
**බ්‍රහ්මමේතං විහාරං ඉධමාහු**

සිටගෙන ඇවිදින හෝ හිඳිනා විට
නිදන වෙලාවට හෝ නො නිදන විට
සිහි කළ යුතු මෙත් සිත ම ය හැම විට
බඹවිහරණ ලෙස පවසයි එම විට

10. **දිට්ඨිං ච අනුපගම්ම සීලවා**
**දස්සනේන සම්පන්නෝ**
**කාමේසු විනෙය්‍ය ගේධං**
**නහි ජාතු ගබ්භසෙය්‍යං පුනරේතී ති**

මිසදිටුවක සිත නොම පැටලෙමිනේ
සිල් ගුණ දම් රැක යන මඟ නිවනේ
කම් සැපයට කිසි විට නො ඇලෙමිනේ
මව් කුස නිදනට යළි නොම පැමිණේ

**ඒතේන සච්චේන සුවත්ථි හෝතු!**
මේ සත්‍යානුභාවයෙන් සැමට සෙත් වේවා!